# දකුණු ආසියාව තුළ ස්ත්‍රී දූෂණයට සම්බන්ධ නීති:

## සංසන්දනාත්මක විශ්ලේෂණයක්

Women and Media Collective
Established 1984

Norwegian Embassy
*Colombo*

# දකුණු ආසියාව තුළ ස්ත්‍රී දූෂණයට සම්බන්ධ නීති:
# සංසන්දනාත්මක විශ්ලේෂණයක්


2021 මැයි

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**

පර්යේෂකයන් : උදා දේශප්‍රිය සහ අකේලි කුමාරගේ
සංස්කරණය : ප්‍රශාන්ති මහින්දරත්න සහ කැමීනා ගුණරත්න
පරිවර්තනය : චතුරිකා සෙව්වන්දි
පිටු සැලසුම : ප්‍රියදර්ශනී රාසයියා
සහාය : රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය

Norwegian Embassy
*Colombo*

ප්‍රකාශනය :

Women and Media Collective
Established 1984



**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව
විද්‍යුත් තැපැල: *wmcsrilanka@womenandmedia.org*
වෙබ්: *womenandmedia.org*
ෆේස්බුක්: *https://www.facebook.com/womenandmediacollective*
ට්විටර්: *https://twitter.com/womenandmedia*

# අන්තර්ගතය


**පසුබිම** ..... **1**

**දළ විශ්ලේෂණය** ..... **4**

**දකුණු ආසියානු රටවල ස්ත්‍රී දූෂණයට අදාල නීති රාමු පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්** ..... 5

- **ඉන්දියාව** ..... 6
  - අර්ථකථනය ..... 7
  - දඬුවම් නියම කිරීම ..... 7
  - 377 වන වගන්තිය ..... 7
- **බංගලාදේශය** ..... 8
  - අර්ථකථනය ..... 8
  - 377 වන වගන්තිය ..... 9
- **පාකිස්ථානය** ..... 10
  - අර්ථකථනය ..... 11
  - 377 වන වගන්තිය ..... 11
- **ඇෆ්ගනිස්ථානය** ..... 11
  - ස්ත්‍රී දූෂණය සම්බන්ධව නීතිමය ප්‍රතිසංස්කරණ ..... 12
  - සමලිංගිකත්වය අපරාධ සේ සැළකීම ..... 12
- **නේපාලය** ..... 13
  - ස්ත්‍රී දූෂණයට අදාල පවතින නීති ..... 13
  - ලිංගික නැඹුරුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ ප්‍රගතිශීලී නීති ..... 14
- **භූතානය** ..... 14
  - අර්ථකථනය ..... 15
  - අස්වාභාවික ලිංගික ක්‍රියා ..... 16
- **මාලදිවයින** ..... 16
  - අර්ථකථනය ..... 16
  - සමලිංගික ලිංගික ක්‍රියාව ..... 17
- **ශ්‍රී ලංකාව** ..... 18
  - අර්ථකථනය ..... 18
  - අස්වාභාවික වැරදි සහ බරපතල ලිංගික අපයෝජන පිළිබඳව 365 වන වගන්තිය ..... 19
  - දඬුවම් නියම කිරීම ..... 20
- **ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ නිරීක්ෂණ** ..... 22
  - ස්ත්‍රී දූෂණය අර්ථ දැක්වීම ..... 22
  - විවාහය තුළ ස්ත්‍රී දූෂණය ..... 22
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවී මධ්‍යස්ථ වූ ස්ත්‍රී දූෂණය පිළිබඳ ප්‍රශ්නය ..... 23
  - පුරුෂයින් සහ සංක්‍රාන්තික ලිංගිකයින් දූෂණයෙන් ආරක්ෂා කිරීම ..... 26
  - සමලිංගික සහකරුවන් අතර ලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා නොසැළකීම ..... 28
  - ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය ..... 29
  - දඬුවම් නියම කිරීම ..... 31
  - සාක්ෂි පිළිබඳ නීති ..... 32
- **නිර්දේශ** ..... 34

# පසුබිම

ලිංගික හිංසනය යන්න ව්‍යතිරේඛයක් නොමැතිව සෑම නීති පද්ධතියකම එක්තරා ආකාරයක සාපරාධී අපරාධයක් බවට පත්කොට ඇත. දකුණු ආසියාව තුළ, සෑම රටකම ස්ත්‍රී දූෂණය යන්න අපරාධයක් ලෙස හඳුනාගෙන ඇත. දකුණු ආසියාවේ රටවල් සමූහයක අපරාධ නීතිය බ්‍රිතාන්‍ය පාලන සමය තුළ හඳුන්වාදුන් ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය පදනම් කරගත් නිසා දකුණු ආසියාව පුරා ස්ත්‍රී දූෂණය අර්ථකථනය කිරීමට භාවිතාකොට ඇත්තේ සමාන පාරිභාෂික වචන මාලාවකි.. නේපාලය සහ භූතානය වැනි රටවල නීති තුළ 2010 වසරෙන් පසුව ඔවුන්ගේ දණ්ඩ නීති සංග්‍රහවල සිදුකළ මෑතකාලීන සංශෝධන සහ ප්‍රතිශෝධන අනුව ලිංගික වැරදි සම්බන්ධයෙන් ප්‍රගතිශීලී නැඹුරුවක් පෙන්නුම් කරයි.

ජාත්‍යන්තර නීතිය තුළ ස්ත්‍රී දූෂණය අර්ථ දැක්වීමට උත්සාහගෙන ඇත. ජාත්‍යන්තර නීතිය විසින් සාමාන්‍ය ජනයාට සහ සටන්වලට සහභාගී නොවන අයට එරෙහිව සිදු කරන ස්ත්‍රී දූෂණය මනුෂ්‍යවර්ගයාට එරෙහි අපරාධයක් සහ යුද්ධාපරාධයක් ලෙස හඳුනාගෙන ඇත.[1] රෝම ව්‍යවස්ථාවල එන 'අපරාධවල මූලිකාංග' තුළ ඇති ස්ත්‍රී දූෂණයේ සංඝටකයන් ගුද මාර්ගය මෙන්ම යෝනි මාර්ගය ද ඇතුළත්ව ශරීරයේ 'ආක්‍රමණය' සහ 'ප්‍රවේශනය' යන කොටස්වලින් ද යුතුය. එම ආක්‍රමණය බලය, බලහත්කාරයෙන් හෝ තර්ජනයෙන් සිදුවන්නකි.[2]

ජාත්‍යන්තර අධිකරණ විසින් තවදුරටත් මෙම විධිවිධානය, නඩු තීන්දු ද නීතියේ දී අදාළ නීතිය තුළ, අදාළ කරගත හැකි හැකි බව පැහැදිලිකොට ඇත.

රුවන්ඩාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව (International Criminal Tribunal for Rwanda (ICTR)) *Akayesu*[3] නඩුවේ දී ලිංගික හිංසනය යන්න පහත ආකාරයට අර්ථ දක්වා ඇත:
*"ලිංගික ස්වරූපයක් තුළ ශාරීරික ආක්‍රමණය බලහත්කාරයෙන් පුද්ගලයෙකු මත සිදු කරනු ලැබේ. බලහත්කාරී වූ තත්ත්ව යටතේ පුද්ගලයෙකු මත සිදුකරන ලිංගික ස්වභාවයේ ඕනෑම ක්‍රියාවක් ස්ත්‍රී දූෂණය ද ඇතුළුව ලිංගික හිංසනය ලෙස සැළකේ."*

"*Furundzija* නඩුව තුළ[4] පූර්ව යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව ජාතික අධිකරණවල සමීක්ෂණයක් අනුව යමින් ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන්වන අර්ථකථනයට ඇතුළත් විය යුතු මූලිකාංග මොනවාද යන්න සාකච්ඡා කරන ලදී. මෙය *"යෝනි මාර්ගය, ගුද මාර්ගය හෝ මුඛය තුළට පුරුෂ ලිංගය හෝ වෙනත් වස්තුවක් යෝනි මාර්ගයට, ගුද මාර්ගයට ප්‍රවේශනය කිරීම නම් ක්‍රියාව වේ."*[5]

දේශීය නීති පද්ධති තුළ එන ස්ත්‍රී දූෂණය නමැති පොදු වරද, ජාත්‍යන්තර නීතිය තුළ අර්ථ දක්වා ඇති ස්ත්‍රී දූෂණය නමැති අපරාධය සමග සමාන වුවද, සුවිශේෂීව වෙනස් වේ. ලිංගය මත පදනම් වූ සමානාත්මතාවයට ඇති අයිතිය සහ වෙනස්කොට නොසැළකීමට ඇති අයිතිය දකුණු ආසියාවේ සෑම රාජ්‍යයක් විසින්ම මූලික අයිතියක් ලෙස හඳුනාගෙන ඇත. මෙම හඳුනාගැනීම තිබියදීත් ස්ත්‍රීන්ව නොසළකා හරින ස්ත්‍රී දූෂණයට සම්බන්ධ නීති තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොට ගත් අගතීන් රාශියක් දැකගත හැකිය. නිදසුනක් වශයෙන් ව්‍යතිරේඛයන් කිහිපයක් සහිතව දකුණු

---

1 Respectively Article 7(1)(g) and Article 8(2)(b)(xxii) of the Rome Statute; See UN General Assembly, Rome Statute of the International Criminal Court (last amended 2010), 17 July 1998, ISBN No. 92-9227-227-6, available at: https://www.refworld.org/docid/3ae6b3a84.html.

2 International Criminal Court (ICC), Elements of Crimes, 2011, ISBN No. 92-9227-232-2, available at: https://www.refworld.org/docid/4ff5dd7d2.html

3 *Akayesu*, Jean Paul (ICTR-96-4) Available at https://unictr.irmct.org/en/cases/ictr-96-4 .

4 *Furundzija* [1998] IT-95-17/1-T Available at http://www.icty.org/x/cases/furundzija/tjug/en/fur-tj981210e.pdf

5 එහිම

ආසියාව පුරා විවාහය තුළ සිදුවන ස්ත්‍රී දූෂණයට දඬුවම් නොලැබන තත්ත්වයක් පවතී.[6] ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය, සහ ඇෆ්ගනිස්ථානය යන රටවල වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධයක් ලෙස හඳුනාගෙන නැත.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිවල බලපෑම නිසා ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ නීති මගින් ස්ත්‍රීත්ව වරප්‍රසාද නොමැති තත්ත්වයට ඇද දමන අතර, සමහර දකුණු ආසියානු රටවල ව්‍යවස්ථා තුළ ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවය විශේෂීකොටගත් භාෂාවේ ප්‍රතිඵලයක් ලෙස පුරුෂයෙකුට හෝ සංක්‍රාන්ති ලිංගිකයන්ට එරෙහිව ස්ත්‍රී දූෂණයක්වන විට එය සම්පූර්ණයෙන්ම නොසළකා හරී. සමලිංගික සම්බන්ධතා සාපරධී අපරාධයක් ලෙස අර්ථ දක්වන යටත්විජිත පුංමෛථුන නීති (colonial sodomy laws) යටතේ පුරුෂයින් හෝ සංක්‍රාන්ති ලිංගිකයින්ට එරෙහිව ස්ත්‍රී දූෂණයක් සිදුවන විටද තත්ත්වය මෙයමම වේ.

මෙම ලියවිල්ලෙන් ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය, සහ ශ්‍රී ලංකාව යන රටවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා විශේෂ විධිවිධානවල ගම්‍යවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ නීති පිළිබඳව සාකච්ඡා කරයි. ශ්‍රී ලංකාව තුළ පුරුෂයාට සහ ස්ත්‍රියට සැළකීමේදී දැකිය හැකි වෙනස්කම් ආමන්ත්‍රණය කිරීමට සමත් ප්‍රතිසංස්කරණ පිළිබඳවද මෙහි සාකච්ඡා කරයි.

6 Exceptions are Nepal, Bhutan. In Maldives marital rape is recognized only under certain circumstances; For Maldives *see* 'Country Profile on Universal Access to Sexual and Reproductive Rights: Maldives', Available at https://arrow.org.my/wp-content/uploads/2017/04/Country-Profile-on-Sexual-and-Reproductive-Rights-Maldives.pdf

# දළ විශ්ලේෂණය

මෙම කොටසින් අධ්‍යයනය තුළ අවධානයට ලක්කළ රටවල ස්ත්‍රී දූෂණයට අදාළ නීතිවල තෝරාගත් පැතිකඩ සහ නිරීක්ෂණ පැහැදිලි කරයි.

භූතානයේ සහ මාලදිවයිනේ ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ නීති, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අපක්ෂපාතී භාෂාවක් භාවිතා කරයි. ඉන්දියාව, නේපාලය, බංගලාදේශය, පාකිස්ථානය, සහ ශ්‍රී ලංකාව යන රටවල් තුළ ස්ත්‍රී දූෂණය යන්න පුරුෂයෙකු විසින් ස්ත්‍රියකට එරෙහිව කරනු ලබන ක්‍රියාවක් ලෙස උදාහරණ දක්වමින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සුවිශේෂී භාෂාවක් සහිත, ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ අර්ථකථනය මගින් ඒ වෙනුවෙන් නීතිය යෙදවීම සීමා කරනු ලබයි.

1860 දී යටත්විජිත පාලකයින් විසින් හඳුන්වාදෙනු ලැබූ ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය පාකිස්ථානය වෙන්වූ පසුව සහ බංගලාදේශයේ නිදහසින් පසුව එම රටවලට උරුම වී ඇත. එමනිසා, ඉන් අනතුරුව සිදුවූ සංශෝධනවලින් පසුව පවා මෙම රටවල් තුනේ දණ්ඩ නීති සංග්‍රහයේ භාෂාව සමානව පවතී. 2013 වසරෙන් පසුව ස්ත්‍රී දූෂණය සම්බන්ධ ඉන්දියානු නීතිය වැදගත් ප්‍රතිසංස්කරණවලට ලක් වී ඇත. කෙසේවුවත්, 'කැමැත්ත' සම්බන්ධයෙන් වයසෙහි වෙනස්කම් හැරෙන්නට පාකිස්ථානයේ සහ බංගලාදේශයේ දණ්ඩ නීති යටතේ ස්ත්‍රී දූෂණයේ මූලිකාංග එක සමානය.

ඉන්දියාව, බංගලාදේශය, සහ පාකිස්ථානය තුළ ස්ත්‍රී දූෂණය යන්න පුරුෂයෙකු විසින් ස්ත්‍රියකට එරෙහිව සිදුකරනවා හැරුණු විට, පුරුෂයෙකු විසින් පුරුෂයෙකුට එරෙහිව, ස්ත්‍රියක විසින් ස්ත්‍රියකට එරෙහිව, හෝ ස්ත්‍රියක් විසින් පුරුෂයෙකුට එරෙහිව එය සිදු කිරීම යන අනෙකුත් සියලුම අවස්ථාවලදී ස්ත්‍රී දූෂණය තුළ යටත්විජිත පුංමෛථුන නීති ((colonial sodomy laws) යටතේ අපරාධකරුවාට චෝදනා එල්ල කළ හැකිය. අධිකරණ පද්ධති ත්‍රිත්වය තුළම අදාළ දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්තිය මගින් හඳුන්වා ඇති "අස්වාභාවික වැරදි" යන්න "කවර හෝ පුරුෂයෙකු, ස්ත්‍රියක, හෝ සත්ත්වයෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව කාමුක සංසර්ගයෙහි යෙදීම" අපරාධ ගණයෙහි ලා සළකයි. ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමලිංගික ක්‍රියාවන් අපරාධකරණයට ලක්කරන දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්තිය අර්ථ නිරූපණයකොට ඇත.[7]

ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය මත පදනම් වුවද, 1883 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය එහි විශේෂ කොටස් මගින් සමලිංගික ක්‍රියාවන් සහ සමලිංගිකත්වයේ වින්දිතයෙකු මත වැරදි පැටවිය හැකි ලිංගික අපයෝජන අපරාධ ලෙස හඳුනාගනු ලබයි.

365 වගන්තිය මගින් "අස්වාභාවික වැරදි" කවර හෝ පුරුෂයෙකු, ස්ත්‍රියක, හෝ සත්ත්වයෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව කාමුක සංසර්ගයෙහි යෙදීම අපරාධ ගණයෙහි ලා සළකනු ලබන අතර, 365 අ වගන්තිය මගින් පුරුෂයින් අතර තදබල අසෝබන ක්‍රියා අපරාධ ගණයෙහි සළකයි. 365 අ වගන්තිය සමලිංගිකයින් අතර ඇතිවන ලිංගික සබඳතා ඇතුළත් කිරීමට අර්ථ නිරූපණය කිරීම සිදුකොට ඇති අතර[8] 365 ආ වගන්තිය මගින් කැමැත්ත නොමැතිව හෝ කැමැත්ත ගණන් නොගන්නා යන අර්ථය සහිත "බරපතල ලිංගික අපයෝජනය" අපරාධ ගණයෙහි සළකයි.

[7] Though the term 'consensual sex' is widely used, the notion that 'sex' is always consensual as opposed to forms of sexual violence such as rape or sexual assault, renders the use of 'consensual' redundant.

[8] *OIC Maradana vs. GalabadaPayagalageSanathWimalasiri*, SC Appeal No 32/2011, 11-12, Available at http://www.supremecourt.lk/images/documents/sc_appeal_32_11.pdf.

# ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන නීති රාමු:

## දකුණු ආසියානු රටවල් පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක්

## ඉන්දියාව

ඉන්දියානු නීතිය යටතේ, 1860 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ 375 වගන්තිය මගින් 'ස්ත්‍රී දූෂණය' යන්න අර්ථ දක්වයි. 376 පරිපාටිය මගින් ස්ත්‍රී දූෂණයට අදාළව දඬුවම් නියම කරයි.

2012 වසරේ ''*නිර්භයාගේ* නඩුව අනුව යමින් ලිංගික අඩන්තේට්ටම් කිරීමට එරෙහිව ආරක්ෂාව ශක්තිමත් කිරීම වෙනුවෙන් අපරාධ නීතියට සංශෝධන යෝජනා කිරීම සඳහා විනිශ්චය කමිටුවක් පත් කරයි. කමිටුවේ නිර්දේශ මත පදනම් වෙමින් කෙටුම්පත් කළ 2013 අංක 13 දරන අපරාධ නීති සංශෝධන පනත[9] මගින් දණ්ඩ නීති සංග්‍රහයේ 375 වගන්තිය "ස්ත්‍රී දූෂණය" ශීර්ෂය යටතේ පුළුල් වූ විෂය පථය සමග නව 375 වගන්තියක් ආදේශකොට ඇත.[10]

### අර්ථකථනය

ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයෙහි එන ස්ත්‍රී දූෂණය පිළිබඳව අර්ථකථනය 'කැමැත්ත' පිළිබඳව පැහැදිලි කිරීමක් සහිත ස්ත්‍රී දූෂණය පිළිබඳව දකුණු ආසියාවේ එකම අර්ථකථනය වේ.

*පැහැදිලි කිරීම 2 - කැමැත්ත යනු ස්ත්‍රියක් වචනයෙන්, ඉඟියෙන් හෝ ඕනෑම ආකාරයක වාචික හෝ අවාචික සන්නිවේදනයක් මගින් දෙන, විශේෂී ලිංගික ක්‍රියාවක සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කරන ඉතා පැහැදිලි සිය කැමැත්තෙන් වන එකඟතාවයක් වේ.*

ලිංගික සංසර්ගයට ශාරීරිකව විරුද්ධ නොවන ස්ත්‍රියක්, එම කාරණය නිසා පමණක් ලිංගික ක්‍රියාකාරකම් සඳහා එකඟ වෙන අයෙකු ලෙස නොසැළකිය යුතුය. ආසියානු රටවල් අතර ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය, ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පුළුල්ම අර්ථකථනය සපයයි. ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් අර්ථකථනය තුළ ස්ත්‍රියකගේ යෝනියට, මුඛයට, මුත්‍ර මාර්ගයට, හෝ ගුද මාර්ගයට පුරුෂ ලිංගයක්, ශරීරයේ කොටසක් හෝ වස්තුවක් ඇතුළු කිරීම හෝ ඇතුළු කිරීමට සැලසීමේ ක්‍රියාව අඩංගු වේ. ස්ත්‍රියකගේ යෝනියට, මුඛයට, ගුද මාර්ගයට හෝ මුත්‍ර මාර්ගයට මුඛය ගෑමද එයට ඇතුළත් වේ. මෙම කොටසේ අර්ථය සඳහා තවදුරත් යෝනිය යන වචනයට *labia majora* (බාහිර තොල්) ද ඇතුළත් වේ.

ඉහත විස්තර කළ "ඇතුළු කිරීමේ ක්‍රියාව" පහත සිද්ධිවලදී ස්ත්‍රී දූෂණයට අඩංගු වේ:

1. ස්ත්‍රියකගෙ කැමැත්තට එරෙහිව එය සිදු වූ විට
2. ඇයගේ කැමැත්තෙන් තොරව
3. මරණය හෝ වේදනාව සම්බන්ධයෙන් බියට පත් කිරීමෙන් කැමැත්ත ලබාගත් විට
4. අපරාධකරු ඇයගේ ස්වාමි පුරුෂයා යැයි මවා පාමින් කැමැත්ත ලබාගත් විට
5. සිහිවිකල බව හෝ මත්වීම හෝ සිහිමුළා කරන හෝ අයහපත් තත්ත්වයක බලපෑම නිසා ඇය එවැනි කැමැත්තක ස්වභාවය හෝ ප්‍රතිවිපාක තේරුම් ගැනීමට අපොහොසත් වීම සහිත ඇගේ කැමැත්තෙන්
6. ඇයගේ වයස අවුරුදු 18 ට අඩු වූ විට ස්ත්‍රියකගේ කැමැත්ත ඇතිව හෝ නැතිව
7. ඇය කැමැත්ත ප්‍රකාශ කිරීමට අසමත් වූ විට

[9] Available at https://www.refworld.org/docid/54c218784.html.

[10] බලන්න Report of the Committee on Amendments to Criminal Law 'Justice Verma Committee' (2013) https://www.prsindia.org/uploads/media/Justice%20verma%20committee/js%20verma%20committe%20report.pdf.

*UP v. Chottey Lal* (2011) නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ "ඇයගේ කැමැත්තට විරුද්ධව" යන්නෙන් ඇයගේ බලපෑම සහ විරුද්ධත්වය නොතකා පුරුෂයෙක් ස්ත්‍රියක් සමග ලිංගික සංසර්ගයේ යෙදීම සාමාන්‍යයෙන් අදහස් වෙන අතර "ඇයගේ කැමැත්ත නොමැතිව" යන්නෙන් කල්පනාකාරීව සිදුවන තර්කානුකූල ක්‍රියාවක් ලෙස ප්‍රකාශනය වේ.[11]

අර්ථකථනය මගින් "කැමැත්ත" එලදායී නොවන අවස්ථා ගණනාවක් ආවරණය කරයි. කෙසේවෙතත්, භාවිතාකොට ඇති භාෂාව, කැමැත්ත යනු ස්ත්‍රිය ඇයගේ ශරීරය පිළිබඳව දැනුවත්ව ගන්නා තීරණයක් ලෙස ප්‍රකාශ කිරීමට අසමත්ව ඇත. උදාහරණ වශයෙන් නිශ්චිත සිදුවීම් යටතේ කැමැත්ත නොමැති ලිංගික ක්‍රියාකාරකම් සඳහා එකඟ නොවන බව ප්‍රකාශ කිරීමට වඩා පනතෙහි ප්‍රකාශ කරන්නේ 'ඇයගේ කැමැත්ත' ලබාගත් පසුව *ඇයගේ කැමැත්ත ඇතිව...*' යනුවෙනි. මෙම භාෂාව ව්‍යාකූලතාවය ඇති කරයි. සාමාන්‍යයෙන් කැමැත්ත පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් ඇති දුර්වල අවබෝධය යන්න, ලිංගික හිංසනයේ පැවැත්ම සඳහා දායකත්වය සපයන විට, කැමැත්ත පිළිබඳව සංකල්පය සම්බන්ධයෙන් නීති සම්පාදකයින්ගේ, නීති බලාත්මක කරන නිලධාරීන්ගේ, සහ අධිකරණ නිලධාරීන්ගේ දුර්වල අවබෝධය වින්දිතයින්ට චෝදනා කිරීම, යුක්තිය ප්‍රතික්ෂප කිරීම, සහ ලිංගික වරදකරුවන් දඬුවම්වලින් නිදහස් කිරීම යනාදියට දායක වේ.

මෙම අර්ථකථනයේ සීමාව නම් එය වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධ ගණයෙහි ලා නොසැළකීමය. නීත්‍යානුකූල හෝ වෙන ලෙසකින් බිරිඳ වෙන්ව ජීවත්වන තැනදී පවා ස්ත්‍රී දූෂණය සඳහා දඬුවම වන්නේ අවුරුදු හත දක්වා දීර්ඝ කළ හැකි අවම අවුරුදු දෙකක අනිවාර්ය දඬුවම වේ.[12]

ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් මෙම අර්ථකථනය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී විශේෂීයය. පුරුෂයෙකුට එරෙහිව කරන දූෂණය සහ ස්ත්‍රියක් විසින් සිදු කරනු ලබන දූෂණය එයින් බැහැර කරයි.

**දඬුවම් නියම කිරීම**

375 වගන්තිය මගින් විශේෂිත මූලාංග හේතුවෙන් 'වරද' යන්න සාමාන්‍ය වරදට වඩා බරපතල යැයි වටහාගත හැකි අවස්ථා ඇති බරපතල ස්ත්‍රී දූෂණයට අදාළ දඬුවම් විස්තර කරනු ලබයි. එනම් පොලිස් නිලධාරියෙකු, රජයේ සේවකයෙකු, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයෙකු හෝ පුද්ගලයෙකු විසින් දූෂණය කිරීම, වර්ගවාදී හිංසනය අතරතුර දූෂණය ඇතුළුව ස්ත්‍රියක් ගැබ්ගැනීමට හැකි බව දැන දැනම දූෂණය කිරීම, වයස අවුරුදු 16 ට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම සහ ස්ත්‍රී දූෂණය නැවත නැවත සිදු කිරීම ආදිය මෙයට ඇතුළත් නමුත් මේවාට පමණක් සීමා නොවේ.[13]

2018 දී ස්ත්‍රී දූෂණය සඳහා නිර්දේශිත දඬුවම වූ අවුරුදු හතක් දක්වා බන්ධනාගාරගත කිරීමේ අනිවාර්ය අවම දඬුවම, අවුරුදු දහය දක්වා බන්ධනාගාරගත කිරීමේ අනිවාර්ය අවම දඬුවම දක්වා ඉහළ දමා ඇත.[14] මෙය ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමද විය හැකිය.[15] රංචු වශයෙන් කරන ස්ත්‍රී දූෂණය[16], වයස අවුරුදු 16 ට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම,[17] සහ ස්ත්‍රියකගේ මරණයට හේතුවන ලෙසට තුවාලයක් කිරීම අතරතුර කරන ස්ත්‍රී දූෂණය හෝ ඇයව නිරන්තර අවිඥානක තත්ත්වයක තැබීම[18] ආදියට අවම දඬුවම වන්නේ අවුරුදු විස්සක් දක්වා සිරගත කිරීමය. නැවත

11 (2011) 2 SCC 550 Available at https://indiankanoon.org/doc/1408786/.
12 S.376B.
13 S.376 (2) a-n.
14 S.5 of Criminal Law (Amendment) Act No. 22 of 2018.Available at
15 Note that in all cases imprisonment may be coupled with a fine.
16 S.376D.
17 S.376 (3) as amended in 2018.
18 S.376A.

නැවත වැරදි කරන වරදකරුවන්ට[19] සහ වයස අවුරුදු 16 අඩු ස්ත්‍රියක් රංචු වශයෙන් දූෂණය කිරීමට අදාළව ජීවිතාන්තය දක්වා සිර දඬුවමට යටත් කිරීම යන්න නිර්දේශ වී ඇත.[20]

### 377 වැනි වගන්තිය

පුරුෂයෙකුට එරෙහිව කරන දූෂණය හෝ ස්ත්‍රියක විසින් කරනු ලබන දූෂණය "අස්වාභාවික වැරදි" නම් වූ විස්තාරණය වූ 377 වගන්තිය යටතේ අපරාධ ලෙස හඳුනාගෙන ඇත. ස්වේච්ඡාවෙන් කවර හෝ පුරුෂයෙකු, ස්ත්‍රියක, හෝ සත්ත්වයෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව කරන කාමුක සංසර්ගය සඳහා ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් කිරීම හෝ වසර දහයකට සිරගත කිරීම හෝ දඩයකට යටත් කිරීම සිදුවිය හැකි බව වගන්තිය විස්තර කරයි.

2018 වසරේ *Navtej Singh Johar & others vs. Union of India* යන නඩුව තුළ ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එතෙක් දුරට සමලිංගික ක්‍රියාකාරකම අපරාධ ගණයෙහි ලා සැළකූ 377 වගන්තිය අර්ථ නිරූපණය කරනු ලබයි.[21] දණ්ඩ නීති සංග්‍රහයෙහි මෙම වගන්තිය, සමලිංගිකත්වය සඳහා පමණක් අදාළව පවතින බව සහ සියලුම ආකාරයේ 'ශරීරය සම්බන්ධ ලිංගිකත්වය'[22] යන්න අපරාධ ගණයෙහි ලා සැළකීම වැනි මෙම කොටස මගින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත දෙය සමග තාර්කික සම්බන්ධතාවයක් නොමැති විශේෂ වූ ද්වීලිංගික සහ සමලිංගික වැඩිහිටියන් අතර වෙනස්කම් සිදුකොට ඇති බව මෙහිදී අවබෝධ විය. මෙම පදනම මත 377 වගන්තිය මගින් එතෙක් සමලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා සළකනු ලබන නිසා එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බව අනාවරණය කරගන්නා ලදී.

'ස්ත්‍රී දූෂණ' විධිවිධාන මගින් ආවරණය නොවන, විශේෂයෙන්ම වැඩිහිටි පුරුෂයෙකුට එරෙහිව ලිංගික අඩන්තේට්ටමක් සිදුවන විට ලිංගික අඩන්තේට්ටම් නඩු සඳහා 377 වගන්තිය අදාළ කරගැනීම දිගින් දිගටම සිදුවේ. 2012 අංක 32 දරණ ලිංගික අපරාධ මගින් ළමයින් ආරක්ෂා කරගැනීමේ පනත තුළ ළමයෙකුට එරෙහිව ස්ත්‍රී දූෂණය, ඇතුළුව සිදුවන පුළුල් පරාසයක ලිංගික වැරදි අපරාධ ලෙස සළකන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී මධ්‍යස්ථ විධිවිධාන අඩංගුව ඇත.[23]

## බංගලාදේශය

1860 දණ්ඩ නීති සංග්‍රහය යටතේ ලිංගික වැරදි අපරාධ ගණයෙහි ලා සළකා ඇත.[24] දණ්ඩ නීති සංග්‍රහයෙහි 375 වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය අපරාධ ගණයෙහි ලා සළකා ඇත.

### අර්ථ දැක්වීම

375 වැනි වගන්තියට අනුව 'ස්ත්‍රී දූෂණය' යනු පහත දැක්වෙන වාතාවරණ තුළ පුරුෂයෙකු ස්ත්‍රියක් හා ලිංගික සංසර්ගයක නිරත වීමය.

1. ඇයගේ කැමැත්තට එරෙහිව
2. ඇයගේ කැමැත්ත නොමැතිව
3. මරණය හෝ වේදනාව සම්බන්ධයෙන් බියට පත් කිරීමෙන් කැමැත්ත ලබාගත් විට
4. අපරාධකරු ඇයගේ ස්වාමි පුරුෂයා යැයි මවාපාමින් කැමැත්ත ලබාගත් විට
5. ඇයගේ වයස අවුරුදු දහහතර ට අඩු වූ විට ස්ත්‍රියකගේ කැමැත්ත ඇතිව හෝ නැතිව

19 S.376E.
20 S.376DA as amended in 2018.
21 W.P. (Crl) No 76 of 2016 Available at https://sci.gov.in/supremecourt/2016/14961/14961_2016_Judgement_06-Sep-2018.pdf.
22 And 'transgender sex'.
23 Available at https://wcd.nic.in/sites/default/files/childprotection31072012.pdf.
24 Available at http://bdlaws.minlaw.gov.bd/pdf_part.php?id=11.

'කැමැත්ත' යන්න දණ්ඩ නීති සංග්‍රහය තුළ අර්ථ දක්වා නැත. 1872 සාක්ෂි පනතේ[25] 155 (4) වගන්තිය මගින් පැමිණිලිකරුට චෝදනා ඉදිරිපත් කිරීමට සලස්වන ආකාරයෙන් 'නඩු පවරන්නා සාමාන්‍යයෙන් දුරාචාරවත් චරිතයක්' බවට ඔප්පු කරන සාක්ෂි සැපයීම සඳහා ඉඩකඩ සපයනු ලබයි. පැමිණිලිකරුගේ ලිංගික ඉතිහාසය / ලිංගික චර්යාව අධිකරණ කාමරය තුළදී විත්තියේ නීතිඥවරු විසින් වින්දිතයින් ලැජ්ජාවට පත්කරනු ලැබීමට බොහෝ විට ගෙන එනු ලබන නිසා සහ වින්දිතයින්ගේ යුක්තිය ප්‍රතික්ෂේප කිරීමට කැමැත්ත සම්බන්ධ යල්පැනගිය සහ ඒකකෘතික අදහස් භාවිතයට මෙය ඉඩ සලසයි.[26]

'ප්‍රවේශනය' යන්න පමණක් ලිංගික සංසර්ගය අඩංගු කිරීමට ප්‍රමාණවත් බව පැහැදිලි කිරීම තුළ සටහන් වේ.

කෙසේවෙතත්, අර්ථකථනය තුළ වෛවාහික ස්ත්‍රී දූෂණය බැහැරකොට ඇත.

> *ව්‍යතිරේඛය - පුරුෂයෙකු විසින් වයස අවුරුදු දහතුනට වඩා අඩු නැති ඔහුගේ බිරිඳ සමග ලිංගික සංසර්ගයේ යෙදීම ස්ත්‍රී දූෂණය නොවේ.*

376 වගන්තිය ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් කිරීමක් හෝ අවුරුදු දහයක් දක්වා එය දීර්ඝ කිරීමක් හෝ දඩයකට යටත් කිරීම නියම කරයි. වයස අවුරුදු 12 කට අඩු බිරිඳට විරුද්ධව පුරුෂයෙකු ස්ත්‍රී දූෂණය සිදු කරන විට ඔහු අවුරුදු දෙක දක්වා දීර්ඝ විය හැකි සිර දඬුවමකට යටත් වීම හෝ ඒ සමග දඩයක් හෝ ඒ දෙකටම දඬුවම් ලැබිය හැකි බව එය තවදුරටත් දක්වයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවී විශේෂී 375 වගන්තිය පුරුෂයින්ගේ දූෂණය යන්න එහි අර්ථකථනය තුළින් බැහැර කරයි. සමලිංගික ක්‍රියාව ද අපරාධ ගණයෙහි ලා සැළකෙන 377 වගන්තිය යටතේ ලිංගික දූෂණයද ඇතුළුව පුරුෂයන්ට එරෙහිව කරන ලිංගික අඩන්තේට්ටම් කිරීම ආවරණයකොට ඇත.

### 377 වැනි වගන්තිය

"අස්වාභාවික වැරදි" යනුවෙන් නම් කළ 377 වගන්තිය මගින් "පුරුෂයෙකු, ස්ත්‍රියක, හෝ සත්වයෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව සිය කැමැත්තෙන් කරන කාමුක සංසර්ගය" අපරාධ ගණයෙහි ලා සළකනු ලබයි. මෙම වරද සඳහා ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් කිරීමක් හෝ අවුරුදු දහයක් දක්වා එය දීර්ඝ කිරීම සහ දඩයකට යටත් කිරීම සිදු වේ.

එම 377 වගන්තිය ප්‍රායෝගික භාවිතය තුළ බලාත්මක වී නැති බවට බංගලාදේශයෙන් වාර්තා වී ඇත. 2015 වාර්තාවක'*377 වගන්තිය යටතේ සිද්ධි කීපයක් ලේඛනගත වී ඇතත් පුරුදු පරිදි සාක්ෂිකරුවන් හෝ සාක්ෂි අඩුවීම නිසාවෙන් ඒවායින් කිසිවක් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හෝ දඬුවම් දීම් දක්වා ගෙනගොස් නැත*[27] යනුවෙන් සටහන්කර ඇත. මත්ද්‍රව්‍ය සම්බන්ධ නීති වැනි අනෙකුත්

---

25 Available at http://bdlaws.minlaw.gov.bd/print_sections_all.php?id=24.

26 Bangladesh Legal Aid and Services Trust, *Character Evidence. In Rape TrialsA Comparative Study of Rape Shield Laws and the Admissibility of Character Evidence in Rape Cases* (2015 Norton Rose Fulbright), Available at https://www.trust.org/contentAsset/raw-data/7c70a653-6c85-4734-981b-72a1de7db614/file.

27 Report on the mission to the People's Republic of Bangladesh' (2015 France: Office français de protection des réfugiés etapatrides (OFPRA)) Available at http://www.refworld.org/docid/577ccdf44.html.

නීති මෙන් නොව 377 වැනි වගන්තිය යටතේ මිනිසුන්ට චෝදනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව කරුණු සෙවීමේ මෙහෙයුමකදී ගම්‍ය වූ බවට 2017 දී UK Home Office වාර්තාකොට ඇත.[28]

## පාකිස්ථානය

මූලිකවම, 1860 පාකිස්ථානු දණ්ඩ නීති සංග්‍රහය[29] ස්ත්‍රී දූෂණ වැරැද්ද සමග සම්බන්ධවී පැවතිණි. ස්ත්‍රී දූෂණයද ඇතුළුව අනාචාරය සහ සහ වෛවාහික නොවන ලිංගික ක්‍රියා අපරාධ ගණයෙහි ලා සැළකූ නීති පද්ධතියක් වූ Hudood අඥා පනත් 1979 දී පනවන ලදී. Zina ආඥා පනතේ[30] (Hudood බලාත්මක කරන) වැරදි අන්තර්ගත 19 වැනි වගන්තිය ස්ත්‍රී දූෂණය ආවරණය කළ දණ්ඩ නීති සංග්‍රහයේ එන වගන්ති අවලංගුකොට ඒ වෙනුවට 'zina-bil-jabr' යන්න අපරාධ ගණයෙහි ලා සළකා ඇත. [A කොටස] පුද්ගලයෙක්, ස්ත්‍රියක හෝ පුරුෂයෙකු සමග ලිංගික සංසර්ගයේ යෙදෙනවානම්, ඔහු හෝ ඇය ඇත්තටම සිටින්නේ විවාහවී නොමැති තත්ත්වයක නම් ආඥා පනතෙහි කියවෙන ආකාරයට එම පුද්ගලයා zina-bil-jabr ට සම්බන්ධ වේ.' නීතිය මගින් ස්ත්‍රී දූෂණය, විවාහයෙන් පිටත ලිංගික සම්බන්ධතා, සහ අනාචාරය අතර ඇති වෙනස්කම් මකා දමනු ලැබ ඇත.

*"තවදුරටත්, Zina ආඥා පනත මගින් සාක්ෂිවලට ඉඩ සලසා ඇති එකම ආකාර වූයේ චූදිතයාගේ පාපෝච්චාරණය / වරද පිළිගැනීම හෝ සියැසින් දුටු පිරිමි සාක්ෂිකරුවන් හතර දෙනෙකුගේ සාක්ෂි යන ඒවාය. පැමිණිල්ල තුළ ඇය ලිංගික සංසර්ගයේ යෙදුණු බවට පිළිගෙන ඇත්නම් දූෂණය සම්බන්ධයෙන් පැමිණිල්ලකට ලක්වන ඕනෑම ස්ත්‍රියක් මෛථුන හෝ අනාචාර hadd අපරාධයේ වරදකාරියක් විය හැකිය යන්න මෙයින් අදහස් වේ (සහ සම්පූර්ණයෙන්ම වරද ඔප්පු කිරීමට අවශ්‍ය සාක්ෂි සැපයීමට නිශ්චිතව අසමත් වේ නම්)"*[31]

මෙය ලිංගික අඩන්තේට්ටම්වලට වින්දිතයන් වූ බොහෝ දෙනෙකු ඔවුන් නීති විරෝධී ලිංගික ක්‍රියාකාරකම් සඳහා වැරදිකරුවන් බව සළකමින් අපරාධ යුක්ති ක්‍රියා පිළිවෙල මගින් සහන සෙවීමෙන් වළක්වා තිබේ.[32]

2006 දී ස්ත්‍රීන්ගේ ආරක්ෂාව පිළිබඳ පනත (අපරාධ නීතිය සංශෝධනය)[33] ස්ත්‍රී දූෂණය යන්න දණ්ඩ නීති සංග්‍රහය තුළට අපරාධ ගණයෙහි ලා සළකමින් ව්‍යවස්ථා විධිවිධාන නැවත හඳුන්වා දෙන ලදී. වර්තමානයේ 376 වැනි වගන්තිය මගින් අදාළ දඬුවම් නිර්දේශ කරන විට 375 වැනි වගන්තිය මගින් ස්ත්‍රී දූෂණ වැරද්ද අර්ථකථනය කරයි.

[28] Report of a Home Office Fact-Finding Mission to Bangladesh (2017 UK Home Office), Available at https://www.gov.uk/government/publications/bangladesh-country-policy-and-information-notes See also https://assets.publishing.service.gov.uk/government/uploads/system/uploads/attachment_data/file/660538/Bangladesh_-_SOGI_-_CPIN_-_v3.0__Nov_2017.pdf.

[29] Available at https://www.refworld.org/cgi-bin/texis/vtx/rwmain/opendocpdf.pdf?reldoc=y&docid=54f834c96

[30] Available at https://www.refworld.org/pdfid/4db999952.pdf

[31] SheharBano Khan and ShirinGul, *The Crimialisation of Rape in Pakistan: CMI Working Paper number 8* (2017 Chr. Michelsen Institute) Available at https://www.cmi.no/publications/file/6323-the-criminalisation-of-rape-in-pakistan.pdf

[32] Universal Periodic Review of Pakistan (2008 Human Rights Watch) Available at https://www.refworld.org/docid/4822b4151e.html

[33] Available at http://www.na.gov.pk/uploads/documents/1321341579_812.pdf

**අර්ථකථනය**

375 වැනි වගන්තියට අනුව 'ස්ත්‍රී දූෂණය' යනු පහත දැක්වෙන වාතාවරණ තුළ පුරුෂයෙකු ස්ත්‍රියක් හා ලිංගික සංසර්ගයක නිරත වීමය.

1. ඇයගේ කැමැත්තට එරෙහිව
2. ඇයගේ කැමැත්ත නොමැතිව
3. මරණය හෝ වේදනාව සම්බන්ධයෙන් බියට පත් කිරීමෙන් කැමැත්ත ලබාගත් විට
4. අපරාධකරු ඇයගේ ස්වාමි පුරුෂයා යැයි මවාපාමින් කැමැත්ත ලබාගත් විට
5. ඇයගේ වයස අවුරුදු දහසයට අඩු වූ විට ස්ත්‍රියකගේ කැමැත්ත ඇතිව හෝ නැතිව

376 වැනි වගන්තියෙන් දක්වන පරිදි, ස්ත්‍රී දූෂණය සඳහා චෝදනා ලබන පුද්ගලයෙකුට මරණ දණ්ඩනය හෝ අවුරුදු 25 ක් දක්වා දීර්ඝ විය හැකි අවම වශයෙන් අවුරුදු දහයක සිර දඬුවමක් ලබා දිය යුතුය. රංචු වශයෙන් කරන ස්ත්‍රී දූෂණවලට චෝදනා ලබන පුද්ගලයින් සඳහා මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම නියමකොට ඇත. ස්ත්‍රී දූෂණය සම්බන්ධ අර්ථකථනය ස්ත්‍රීපුරුෂ සමාජභාවීයමත විශේෂීයවන අතර පුරුෂයෙකුට එරෙහිව සිදුවන දූෂණය එයට ඇතුළත් නොවේ. එවැනි සිදුවීමකට දණ්ඩ නීති සංග්‍රහයෙහි සමලිංගික ලිංගික ක්‍රියාකාරකම අපරාධ ගණයෙහි ලා සළකන 377 වැනි වගන්තිය යටතේ නඩු පැවරීමකට යටත් කළ හැකිය.

**377 වැනි වගන්තිය**

"අස්වාභාවික වැරදි" යනුවෙන් නම් කළ පාකිස්ථානු දණ්ඩ නීති සංග්‍රහයෙහි 377 වැනි වගන්තිය " පුරුෂයෙකු, ස්ත්‍රියක, හෝ සත්තවයෙකු සමග ස්වභාව ධර්මයට විරුද්ධව සිය කැමැත්තෙන් කරන කාමුක සංසර්ගය" අපරාධ ගණයෙහි ලා සළකනු ලබයි. මෙම වැරද්ද සඳහා ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් කිරීමක් හෝ අවුරුදු දහයක් දක්වා එය දීර්ඝ විය හැකි අවුරුදු 2 ක සිර දඬුවමකට සහ දඩයකට යටත් කිරීම සිදු වේ. "කාම සංසර්ගය" යනුවෙන් නියම කරන දෙය අධිකරණය මගින් සොයා බලා නොමැති අතර පාකිස්ථානයෙන් වාර්තාවන නඩු තීන්දු මගින් ඉදිරිපත් කරන්නේ 377 වැනි වගන්තිය යටතේ ළමුන් වින්දිතයින් බවට පත්විය හැකිය යන්න පමණි.[34]

## ඇෆ්ගනිස්ථානය

1976 වසරේදී පැනවුණු ඇෆ්ගනිස්ථානයේ දණ්ඩ නිතී සංග්‍රහය අනාචාරය, කෞමාර මෛථුනය (Pederasty) සහ ගෞරවය කෙළෙසීම ආදිය 426 සහ 427 යන වගන්ති (*'zina'* යනුවෙන් එකට නම් කළ) මගින් අපරාධ ලෙස සළකා ඇත. මෙම වර්ග කිරීම මගින් අනාචාරය සහ ස්ත්‍රී දූෂණය අතර වෙනස පැහැදිලිව වටහාගෙන නැත.

2009 දී, ස්ත්‍රියක් දූෂණයට ලක්වීම යන්න ස්ත්‍රීන්ට එරෙහි හිංසනය පිටුදැකීමේ (Elimination of Violence Against Women (EVAW)) නීතිය යටතේ විශේෂ වරදක් ලෙස හඳුනාගෙන ඇත. මෙම නීතිය ජනාධිපති නියෝගයක් ලෙස බලාත්මක විය.[35] නීතිය මගින් ස්ත්‍රී දූෂණය යන්න අර්ථ දක්වා නැත.

ඇෆ්ගනිස්ථානයේ දණ්ඩ නිතී සංග්‍රහය 2017 දී සංශෝධනය වී ඇත. සංශෝධිත දණ්ඩ නිතී සංග්‍රහය එහි 636-641 ව්‍යවස්ථා තුළ ඇති ආකාරයට ස්ත්‍රී දූෂණය සහ දණ්ඩන විධිවිධාන අර්ථකථනය කරයි.[36]

---

[34] Famiya Masood, The Nation 10/06/2019 "Rape, a gender-neutral crime in Pakistan?", Available at https://nation.com.pk/10-Jun-2019/rape-a-gender-neutral-crime-in-pakistan.

[35] Available at https://www.refworld.org/pdfid/5486d1a34.pdf.

[36] The Revised Penal Code is not available in English. Information in this section is based on published reports.

### ස්ත්‍රී දූෂණ නීතියට ප්‍රතිසංස්කරණ

නව දණ්ඩ නීති සංග්‍රහය තුළ ස්ත්‍රීන්ට එරෙහි හිංසනය පිටුදැකීමේ නීතියට Elimination of Violence Against Women (EVAW)) වඩා ලිංගික හිංසනය සහ ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් සැළකිය යුතු මට්ටමේ නීති අන්තර්ගතය. *zina* හි භාෂාව මත පදනම් නොවූ, සහ බලහත්කාර ලිංගික ක්‍රියාකාරකමට කරන තර්ජන තැතිගැන්වීම භාවිතා කිරීම ද ඇතුළත්ව ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පැහැදිලි සහ වඩා විස්තීරණ / පුළුල් අර්ථකථනයක් එහි අන්තර්ගතය. එය *zina* පනතට වඩා ස්ත්‍රී දූෂණය සඳහා සැළකියයුතු මට්ටමේ දැඩි දඬුවම් සපයන අතර නව දණ්ඩ නීති සංග්‍රහයෙහි ස්ත්‍රී දූෂණය සඳහා උපරිම දඬුවම අවුරුදු 16 ක් දක්වා දඬුවම නියමවන විට නීතිවිරෝධී ලිංගික සම්බන්ධතා සඳහා වන්නේ වසර පහක සිරදඬුවමකි. බරපතල තත්ත්ව තුළ ස්ත්‍රී දූෂණය සඳහා අවුරුදු 20 ක සිරදඬුවමක් නියමවන අතර රංචු වශයෙන් කරන දූෂණය සිද්ධි සඳහා මරණය නිර්දේශකොට ඇත.[37]

ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පැමිණිලි කරන ස්ත්‍රීන්ට, වඩා හොඳ ආරක්ෂාවක් සළකුණු කරන අනෙක් විධිවිධානය දූෂණයට අදාළ වින්දිතයින්ට එරෙහිව නඩු ගෙනයෑම තහනම් කරයි. කෙසේවෙතත්, දූෂණයේ වින්දිතයන් ලෙස සළකන්නෙ කවුද යන්න මෙම විධිවිධානය අර්ථකථනය නොකරන අතර එය ඉතාම පටු ලෙස භාවිතා විය හැකි නිසා ස්ත්‍රී දූෂණය වෙනුවෙන් සැබෑ දඬුවමක් ඉල්ලා සිටිනා ස්ත්‍රියක් පමණක් වින්දිතයෙක් ලෙස සළකනු ලැබේ.[38]

පුරුෂයෙකුට එරෙහිව කෙරෙන දූෂණයට අදාළව නඩුවක් තුළ භාවිතාවන නීති සම්බන්ධයෙන් තොරතුරු නැත.

### සමලිංගික බව අපරාධ ගණයෙහි ලා සැළකීම

ඇෆ්ගනිස්ථානයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 130 වැනි ව්‍යවස්ථාව පොදුවේ සමලිංගික ක්‍රියාව තහනම් කරන ශරියා නීතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසා ඇත.

සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයෙහි 646 වැනි වගන්තිය පුරුෂයින් අතර සිදුවන සමලිංගික ක්‍රියාව වසර දෙකක් දක්වා සිරදඬුවමකට යටත්වන අපරාධයක් සේ සළකයි. 649 වැනි වගන්තිය මගින් ලිංගික සංසර්ගය නොමැති පුරුෂයින් අතර සමලිංගික ඇසුර අපරාධ ගණයෙහි ලා සළකයි. 645 වැනි වගන්තිය ස්ත්‍රීන් අතර සමලිංගික ඇසුර අවුරුද්දක් දක්වා සිරගත කළ හැකි අපරාධයක් සේ සළකයි.

## නේපාලය

2017 අපරාධ (නීති) පනත (2074)[39] ලිංගික වැරදි සඳහා නීතිය ලෙස නේපාලය තුළ ගණන් ගැනේ. 2017 ජාතික (Muluki) අපරාධ නීති සංග්‍රහය (පනත), 2017 ජාතික (Muluki) අපරාධ නඩු විධාන පනත, සහ අපරාධ වැරදි (දඬුවම් නියම කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ) පනත යනාදිය අපරාධ වැරදි සම්බන්ධයෙන් නේපාලයේ නීති රාමුව සකසන 2017 දී බලාත්මක වූ ඒවාය. 2017 දී සම්මත කරගත් අපරාධ නඩු විධාන පනත තවත් පනත් පහක් සමග 2021 සිවිල් නඩු සංග්‍රහය (Civil Code) වෙනුවට සකස් විය. සංග්‍රහයේ 14 වැනි පරිච්ඡේදය ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් සහ අතර, 15 වැනි පරිච්ඡේදය ව්‍යභිචාරය සම්බන්ධයෙන් සඳහන් කරයි.[40]

---

[37] Torunn Wimpelmann, Adultery, rape, and escaping the house: The protection and policing of female sexuality in Afghanistan: CMI Wprking Paper 2017:9 (2017 Chr. Michelsen Institute) Available at https://www.cmi.no/publications/6404-adultery-rape-and-escaping-the-house.

[38] එහිම.

[39] Official Publication is not available in English. An unofficial translation can be found at http://www.asianlii.org/np/legis/laws/marrc14276/.

[40] International Commission of Jurists, 'Serious Crimes in Nepal's Criminal Code Bill 2014', A Briefing Paper (March 2017).

### ස්ත්‍රී දූෂණයට අදාළව පවතින නීති

නේපාලයේ අපරාධ නීති සංග්‍රහයේ 219 ව්‍යවස්ථාව යටතේ *'karanisambandhikasur'* යන නමින් ස්ත්‍රී දූෂණයට හෝ 'ලිංගික/ලිංගික ප්‍රවේශනයට අදාළ අපරාධවලට' එරෙහිව විධිවිධාන සකස් කරයි. 219 ව්‍යවස්ථාව යටතේ *'Jabarjastikarani'* එනම් 'බල කරන ලද ප්‍රවේශනය' ස්ත්‍රී දූෂණය අර්ථකථනය කරයි. මෙම අර්ථකථනය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී විශේෂී එකකි. 219 වැනි ව්‍යවස්ථාවේ 2 වැනි වගන්තිය "ඇයගේ කැමැත්ත නොමැතිව ස්ත්‍රියක් සමග සහ කැමැත්ත සහිතව වයස අවුරුදු 18ට අඩු ළමයෙකු සමග ලිංගික සම්බන්ධතාවය පැවැත්වීම" දූෂණය ලෙස අර්ථකථනය කරයි.[41] 219 ව්‍යවස්ථාව තවදුරටත් *"මුඛය, ගුදය, තුළට පුරුෂ ලිංගය ඇතුළු කිරීම, මුඛය හෝ යෝනිය තුළට පුරුෂ ලිංගය අඩ වශයෙන් ඇතුළු කිරීම, සහ යෝනිය තුළට වෙනත් වස්තුවක් ඇතුළු කිරීම ස්ත්‍රී දූෂණය ලෙස ගිණිය හැකිය"* යන්න දක්වයි.

නේපාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ස්ත්‍රී දූෂණයක් සඳහා චෝදනා ඉදිරිපත් කිරීමට "ප්‍රවේශනය" පිළිබඳ අවශ්‍යතාවය අවධාරණයකොට ඇත. *Government of Nepal v. Tek Bahadur Chhetri (2007)*[42] නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය දැක්වූයේ "වින්දිත ගැහැණු ළමයා ඉතා අඩු වයසක සිටීම නිසා" යෝනි "ප්‍රවේශනය" කළ නොහැකි වී ඇති බවත් ස්ත්‍රී දූෂණය කිරීමට තැත් කිරීමට පමණක් චෝදනා කළ හැකි බවය.

වෛවාහික ස්ත්‍රී දූෂණය නේපාලය තුළ අපරාධයක් ලෙස හඳුනාගෙන ඇත. නේපාලයේ දණ්ඩ නීති සංග්‍රහයේ 219 වැනි ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියේ කියවෙන පරිදි වෛවාහික ස්ත්‍රියක් සහකරුවා අතින් දූෂණයට ලක්වේ නම් ඔහු අවුරුදු 5 ක් සිරගත කළ හැකිය.

නීති සංග්‍රයෙහි 226 වැනි ව්‍යවස්ථාව යටතේ පුරුෂයෙකුට එරෙහිව ලිංගික දූෂණය සඳහා චෝදනා ඉදිරිපත් කරයි. "කිසිවෙකු කැමැත්ත නොමැතිව තවත් පුද්ගලයෙකු සමග අස්වාභාවික ලිංගික ක්‍රියාවේ නිරත නොවිය යුතුය" යන්න සංග්‍රහයේ කියවෙයි. ශ්‍රී ලංකාව හා සමානවම "අස්වාභාවික ලිංගිකත්වය" යන වචනය නීති සංග්‍රයෙහි අර්ථකථනයකොට නැත.[43]

### ලිංගික නැඹියාව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධ ප්‍රගතිශීලී නීති

දකුණු ආසියාවේ එහි අනෙකුත් අසල්වැසියන්ට වෙනස්ව නේපාලය "අස්වාභාවික ලිංගිකත්වය" යන බහු අරුත් ඇති වචනය යටතේ සමලිංගික හැසිරීම අපරාධ ගණයෙහි ලා සළකන්නෙ නැත. *Sunilbabu Pant vs. Government of Nepal (2007)*[44] නඩුව තුළ නේපාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය නෛතිකව තෙවන ලිංගය යන්න හඳුනාගනී. අධිකරණය විසින් විවිධ ලිංගික නැඹියාවන් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත මිනිසුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කරනු ලැබූ අතර කමිටුවේ නිර්දේශ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමෙන් පසුව නෛතික විධිවිධාන සකස් කිරීම සඳහා ආණ්ඩුවට නිර්දේශ කරනු ලැබීය.

නේපාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් 'ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සහ ලිංගික සුළුතර කණ්ඩායම්' වලින් එන මිනිසුන් ගැන සඳහන් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 (3) ව්‍යවස්ථාව දක්වන්නේ සමානාත්මතා අයිතිය යටතේ ලිංගික සුළුතරවල ආරක්ෂාව, ඔවුන් සවිබල ගැන්වීම හෝ ඔවුන්ගේ දියුණුව සඳහා නීතියෙන් විශේෂ විධිවිධාන සැලසීම වැළැක්වීමට කිසිවක් සැළකිල්ලට නොගත යුතු

41 Priyanka Chand, "Nepal's rape laws fail to adequately protect victims" 12/11/2019 Available at https://www.recordnepal.com/perspective/opinions/nepals-rape-laws-fail-to-adequately-protect-victims/.

42 *Government of Nepal vs. TekBahadurChhetr*i, Nepal KanoonPatrika 2066 (BS), Issue 5, decision no. 8142. Available at https://www.icj.org/wp-content/uploads/2017/03/Nepal-Serious-Crimes-Bill-Advocacy-Analysis-Brief-2017-ENG.pdf.

43 40 සටහන බලන්න.

44 *Sunilbabu Pant vs. Government of Nepal, Prime Minister and Council of Ministers and Others*, Nepal KanoonPatrika 2065 (BS), Issue 4, decision no. 7958. Available at https://www.icj.org/wp-content/uploads/2012/07/Sunil-Babu-Pant-and-Others-v.-Nepal-Government-and-Others-Supreme-Court-of-Nepal.pdf.

බවයි. සමාජ සාධාරණත්වයට ඇති අයිතිය පිළිබඳව 42 (1) වගන්තියෙන් "ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සහ ලිංගික සුළුතර කණ්ඩායම්" ගැන සඳහන් කරයි.[45]

## භූතානය

2019 ජූලි 01 වැනි දා සිට 31 වැනි දක්වා භූතාන රාජ්‍යයෙන් ලැබුණු වාර්තාවලට අනුව ස්ත්‍රී දූෂණ සිද්ධි 22 ක් වාර්තාවන අතර ඉන් 12 ක් වයස අවුරුදු 18 ට වැඩි සහ 09 ක් වයස අවුරුදු 18 ට අඩු ළමුන් සම්බන්ධ ඒවාවන අතර එක් සිද්ධියක් වයස අවුරුදු 12 ට අඩු ළමයෙකු සම්බන්ධ එකකි.[46] වින්දිතයන් ගේ ස්ත්‍රී පුරුෂභාවය වටහා ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් වෙන්කළ දත්ත නොමැත. 2009 වසරේ දී CEDAW කමිටුව ඔවුන්ගේ සමාප්ත නිරීක්ෂණවලදී භූතානය තුළ ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් වෙන්කළ දත්ත රැස් කිරීමේ අවශ්‍යතාවය මතු කළේය.[47]

2004 වසරේ භූතානයේ දණ්ඩ නීති සංග්‍රහය සහ 2011 දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධන පනත මගින් භූතානය තුළ ලිංගික වැරදි නියම කරනු ලැබීය.[48] මෑතකාලීනව පැනවූවක් ලෙස භූතානයේ දණ්ඩ නීති සංග්‍රහය සංවිධානාත්මක ව්‍යුහයක් නිදර්ශනය කරන අතර ලිංගික වැරදි ක්ෂේත්‍රය තුළ ඇති මෑතකාලීන වර්ධනයන් සහ සූක්ෂ්මතාවයන් හඳුනා ගනී.

දණ්ඩ නීති සංග්‍රහයෙහි 14 වැනි පරිච්ඡේදය[49] ලිංගික වැරදිවල ආකාර කිහිපයක් හඳුනා ගනී. ස්ත්‍රී දූෂණය, විවාහක පුද්ගලයෙකුට කරන දූෂණය, ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 12 ට අඩු ළමුන් සහ නොහැකියාව සහිත පුද්ගලයින්), වයස අවුරුදු 12 ට වැඩි ළමයෙකු දූෂණය, ගර්භණී ස්ත්‍රියක් දූෂණය, රංචු වශයෙන් කරන දූෂණය, විවාහක පුද්ගලයෙකුට රංචු වශයෙන් කරන දූෂණය, වයස අවුරුදු 12 ට අඩු ළමයෙකු, අවුරුදු 12 ට වැඩි ළමයෙකු හෝ ගර්භණී ස්ත්‍රියක් රංචු වශයෙන් දූෂණය, හිර අඩස්සියේදී සිදුවන දූෂණය, වෛවාහික ස්ත්‍රී දූෂණය, තුවාල සිදු කිරීම, වින්දිතයාට වන්දි ගෙවීම, ළමා හිරිහැරය, ලිංගික හිරිහැරය, ව්‍යභිචාරය, අසභ්‍ය ප්‍රදර්ශනය, පශු මෛථුනය, සහ අස්වාභාවික ලිංගික ක්‍රියාවන් ආදී සියලුම දේ එයට අන්තර්ගත වේ.

### අර්ථකථනය

මෙම පරිච්ඡේදය තුළ ඇති සියලුම වගන්ති සහ අර්ථකථන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අපක්ෂපාත සහ " ගර්භණී ස්ත්‍රියක" ලිංගික බලහත්කාරයට ලක්වීමේ සිද්ධියකදී හැරෙන්නට ඒ තුළ පාර්ශ්ව " වින්තිකරු" ලෙස, හෝ "පුද්ගලයා" ලෙස සඳහන් කරයි. දණ්ඩ නීති සංග්‍රයෙහි 177 වගන්තිය ලිංගික බලහත්කාරී වරද පහත ආකාරයට අර්ථකථනය කරයිඃ

---

45 Available at https://www.constituteproject.org/constitution/Nepal_2015.pdf.

46 'Rape of Minors Highest Last Year' (Business Bhutan, Thimpu) 16 August 2017 Available at https://www.businessbhutan.bt/2017/08/16/rape-of-minors-highest-last-year/.

47 Committee on the Elimination of Discrimination against Women, 'Concluding observations of the Committee on the Elimination of Discrimination against Women: Bhutan' (Forty-fourth session 20 July-7 August 2009), 8 Available at https://www.refworld.org/publisher,CEDAW,,BTN,,,0.html.

48 Available at http://www.nab.gov.bt/assets/uploads/docs/acts/2014/The_Penal_Code(Amendment)_Act_of_Bhutan_2011eng7th.pdf.

49 Available at https://www.wipo.int/edocs/lexdocs/laws/en/bt/bt019en.pdf.

*177. දූෂණය*

*වින්තිකරු තවත් පුද්ගලයෙකු සමග ලිංගික සංසර්ගයෙහි යෙදී ඇත්නම් වින්තිකරුවෙක් දූෂණ වරදට වරදකරු විය හැකිය:*

*(a) පුද්ගලයෙකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිවල පුද්ගලයෙකු හෝ තුන්වැන්නෙක් මරණ බයට හෝ දරුණු හිංසාවකට ලක් කිරීමෙන් කැමැත්ත ලබාගෙන ඇති විට;*

*(b) බලහත්කාරයෙන්, මරණ තර්ජනයෙන්, ශාරීරික පීඩාවෙන්, බරපතල ශාරීරික පීඩාවෙන් හෝ සාහසික අපරාධයක් කිරීමෙන් එම පුද්ගලයාට හෝ තුන්වැන්නෙක්ට ලිංගික සංසර්ගයේ යෙදෙන්නට අනෙක් පුද්ගලයාට බල කිරීම;*

*(c) ලිංගික සංසර්ගයට පුද්ගලයාගේ ඇති ප්‍රතිරෝධය වැළැක්වීමේ අරමුණින් කැමැත්තකින් තොරව මත්ද්‍රව්‍ය, මද්‍යසාර, හෝ වෙනත් ද්‍රව්‍යයක් සැපයීමෙන් අනෙක් පුද්ගලයා සතු හැසිරීම පාලනය කිරීමේ හැකියාව සැළකිය යුතු ලෙස අඩු කිරීමෙන් හෝ*

*(d) ලිංගික සංසර්ගයේ යෙදීමේ අරමුණින් අනෙක් පුද්ගලයා අවිඥානික තත්ත්වයට පමුණුවීම.*

කෙසේවෙතත්, දණ්ඩ නීති සංග්‍රහය හෝ 2011 සංශෝධනය හෝ ලිංගික බලහත්කාරය ඔප්පු කිරීම සඳහා ඇති කළ යුතු භාරය පැහැදිලි කිරීම සඳහා "ලිංගික සංසර්ගය" යන්න අර්ථකථනයකොට නැති අතර එය ස්වයං පැහැදිලි කිරීමක් ලෙස දක්වයි; ඒ කෙසේද යත් ශ්‍රී ලංකාව හෝ අනෙකුත් රටවලට වඩා වෙනස්ව ලිංගික සංසර්ගයට සැපිරිය යුතු අවශ්‍යතාවයක්වන ප්‍රවේශනය සම්බන්ධයෙන් සඳහනක් මෙහි නැත. මෙය ක්‍රියාව මගින් ප්‍රවේශනය ඇතුළත් කරගත යුතුද හෝ අඩු බලපෑමක් තිබිය යුතුද යන්න හඳුනාගැනීමට සහාය නොදේ. ඒ අතරම කැමැත්ත යන්න අර්ථකථනයකොට නැත.

177 වැනි වගන්තිය මගින් පුරුෂයින්ට එරෙහිව හා ස්ත්‍රීන් විසින් කරනු ලබන ලිංගික බලහත්කාරයට ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයන අතර "අස්වාභාවික වැරදි" වරද යටතේ සමලිංගිකයින් අතර ස්වේච්ඡාවෙන් සිදුවන ලිංගික ක්‍රියා අපරාධ සේ සළකනු ලබයි.

## අස්වාභාවික ලිංගික ක්‍රියා

දණ්ඩ නීති සංග්‍රහයෙහි 213 වැනි වගන්තිය මගින් "පුංමෛථුනය ((sodomy l) හෝ වෙනත් ස්වභාව ධර්මයට එරෙහි ඕනෑම ලිංගිකමය හැසිරීමක්" ලෙස අර්ථකථනය වූ "අස්වාභාවික ලිංගික ක්‍රියා" වරදක් සේ සළකනු ලබයි. නමුත් 214 වැනි වගන්තිය විසින් එම වරද මෙම නීතිය යටතේ දෝෂණය නොමැති "සුළු වැරැද්දක්" ලෙස සළකනු ලැබීමට ඉඩ ඇත.

2019 ජූලි මාසයේදී දණ්ඩ නීති සංග්‍රහයෙහි 213 සහ 214 යන වගන්ති අවලංගු කිරීම සඳහා පක්ෂව එක් ඡන්දයක් හැර අනෙක් සියලු දෙනාම එක්ව පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලය මගින් පනතක් සම්මත කෙරිණි. මෙම පනත නීතියක් බවට පත් කිරීමට නම් භූතානයේ ඉහළ මන්ත්‍රී මණ්ඩලයවන ජාතික සභාව විසින් සම්මත කරනු ලැබිය යුතුය.[50]

[50] Alasdair Pal, 'Bhutan's lower house of parliament votes to decriminalise homosexuality' (Reuters) 07/06/2019, Available at https://www.reuters.com/article/bhutan-lgbt/bhutans-lower-house-of-parliament-votes-to-decriminalise-homosexuality-idUSL4N23E1XG.

## මාලදිවයින

මාලදිවයිනේ ලිංගික වැරදි සම්බන්ධ නීතිය මෑතකාලීන වන අතර ලිංගික හිංසනයට ගොදුරු වූ පුරුෂයින්ට සහ ස්ත්‍රීන්ට සමාන ප්‍රමිති පිළිබිඹු කරයි. මාලදිවයිනේ 2014 අංක 6 දරණ දණ්ඩ නීති සංග්‍රහය, 2014 ලිංගික හිංසනය වැළැක්වීමේ පනත සහ 2014 ලිංගික අපරාධ පනත[51] මගින් ලිංගික අපරාධ විස්තර කරනු ලැබ ඇත.

### අර්ථකථනය

ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අපක්ෂපාතී භාෂාව භාවිතයෙන් දණ්ඩ නීති සංග්‍රහයෙහි 130 වැනි වගන්තිය මගින් ලිංගික බලහත්කාරය යන්න අපරාධ ගණයෙහි ලා සාකච්ඡා කරනු ලබයි.

> 130 වැනි වගන්තිය - ලිංගික අඩන්තේට්ටම් කිරීම
>
> *(a) වරද විස්තර කිරීම - ඔහු කැමැත්ත රහිතව ලිංගික සංසර්ගයක නියැළේ නම් එම පුද්ගලයා වරදක් සිදු කරයි.*

411 (a) (1) සහ (2) වැනි වගන්ති "නීති විරෝධී ලිංගික සංසර්ගය" නම් වරද "ලිංගික සංසර්ගය" හෝ "සමාන ලිංගය සහිත පුද්ගලයෙකු සමග කරන සංසර්ගය" මගින් සිදුවිය හැකි බව දක්වයි.

දණ්ඩ නීති සංග්‍රහයෙහි 411 (f) (1) වගන්තිය මගින් ලිංගික සංසර්ගය අඩංගු කරගන්නේ මොනවාද යන්න පහත ආකාරයට දක්වා ඇත:

> (1) "නීති විරෝධී ලිංගික සංසර්ගය" යනු
> පුරුෂයෙක් ඔහුගේ බිරිඳ නොවන හෝ ඔහුගේ පශ්චාත්-වෛවාහික දික්කසාද සමය වෙනුවෙන් බලා නොසිටින ස්ත්‍රියකගේ යෝනියට ඔහුගේ පුරුෂ ලිංගය මද ප්‍රමාණයට හෝ ඇතුළු කිරීමයි.
>
> 410 (ඉ) 3 වගන්තිය මගින් "පශ්චාත්-වෛවාහික සමය" අර්ථ දක්වන්නේ දික්කසාද වූ ස්ත්‍රියක් සඳහා දික්කසාද වූ දිනයේ සිට මාස 03 ක කාලයක් සහ ස්වාමි පුරුෂයා මරණයට පත් වූ දින සිට මාස 04 ක කාලයක් ලෙසය.
>
> (2) "සමලිංගික සංසර්ගය" යනු
> (a) ලිංගික සතුට සඳහා පුරුෂයෙකු තමාගේ ලිංගේන්ද්‍රය හෝ ඕනෑම වස්තුවක් තවත් පුරුෂයෙකුගේ ගුද මාර්ගයට ඇතුළු කිරීම, හෝ පුරුෂයෙකුගේ ලිංගේන්ද්‍රය තවත් පුරුෂයෙකුගේ මුඛයට ඇතුළු කිරීම,
> හෝ
> (b) ලිංගික සතුට සඳහා ස්ත්‍රියක් තමාගේ ලිංගේන්ද්‍රය හෝ ඕනෑම වස්තුවක් තවත් ස්ත්‍රියකගේ යෝනියට හෝ ගුද මාර්ගයට ඇතුළු කිරීම යි.

ඉහත අංක (1) මගින් ලිංගික බලහත්කාරය සහ අනාචාරය යන දෙක අතර වෙනස පැහැදිලිව හඳුනා නොගනී. අංක (2) පැහැදිලි කිරීම මගින් සමලිංගික වින්දිතයෙකුට එරෙහි ලිංගික බලහත්කාරයට අමතරව සමලිංගික ක්‍රියාව යන්න අපරාධ ගණයෙහි ලා සළකනු ලබයි.

කෙසේවෙතත්, මෙම නීතිය මගින් පුරුෂයෙකුට එරෙහිව ස්ත්‍රියක් විසින් කරනු ලැබිය හැකි ලිංගික බලහත්කාරය බැහැර කරයි.

---

[51] An official translation of the Code is not available in English. An unofficial translation can be found at https://www.law.upenn.edu/live/files/4203-maldives-penal-code-2014.

130 (d) (1) වැනි වගන්තිය මගින් ව්‍යභිචාරය වැනි බරපතල තත්ත්වයන් යටතට ගැනෙන වරදක් සේ සිදුවන්නේද යන්න මත පදනම් වෙමින් නීති විරෝධී ලිංගික සංසර්ගය සාහසික අපරාධයක් ලෙස වර්ග කරනු ලබයි. ව්‍යභිචාර වරද යටතේ වර්ගීකරණය කරන ලද සම්බන්ධතාවයේ මට්ටම් ශ්‍රී ලංකාවේ නීතියට අදාළ මට්ටම්වලට වඩා පුළුල් බවද නිරීක්ෂණයකොට ඇත.

**සමලිංගික ලිංගික ක්‍රියාව**

411 (a) (2) වගන්තිය මගින් එකම ලිංගයේ පුද්ගලයින් අතර සංසර්ගය වසර අටක් දක්වා සිරදඬුවමක් ලැබිය හැකි අපරාධයක් සේ සළකයි. 412 වැනි වගන්තිය 130 වැනි වගන්තිය සමග කියවා ඇති අතර එමගින් සමලිංගිකයෙකු සමග "ලිංගික සම්බන්ධතා" පැවැත්වීම වසර අටක් දක්වා සිරදඬුවමක් ලැබිය හැකි වරදක් දක්වමින් තහනම් කරයි. "ලිංගික සම්බන්ධතා" යන්න අර්ථ දක්වන්නේ ඉස්ලාමීය ශරියා නීතිය තුළ අවසර දී ඇති හේතුවකින් තොරව වෙනත් පුද්ගලයෙකුගේ ලිංගික අවයව, ගුදය හෝ පියයුරු ස්පර්ශ කිරීම හෝ ඉස්ලාමීය ශරියා නීතිය තුළ අවසර දී ඇති හේතුවකින් තොරව ඔහු / ඇයගේම හෝ වෙනත් පුද්ගලයෙකුගේ ලිංගික අවයව, ගුදය හෝ පියයුරු ස්පර්ශ කිරීමට පුද්ගලයෙකු යෙදවීමය.

## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය[52] 1883 වර්ෂයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ[53] දී මුලින්ම පනවන ලදී. මෙම සංග්‍රහයේ භාවිතාවන භාෂාව ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයේ භාවිතාවන භාෂාවට සමාන වේ. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයෙහි ලිංගිකමය වැරදි සම්බන්ධ විධිවිධාන 1995, 1998, සහ 2006 යන වර්ෂවල සංශෝධනය කොට ඇත.

ශ්‍රී ලංකාවේ අපරාධවල ප්‍රවණතාවලට අනුව, 2006 වසරේ සිට වසර ගණනාවක් පුරා සිදු කරන ලද ලිංගික වැරදි සම්බන්ධව ශ්‍රී ලංකාව සතුව ඉහළ යන අපරාධ වාර්තාවක් පවතී. 2018 වසරේදී වාර්තාගත වූ සංඛ්‍යා ලේඛන නම්: අවුරුදු 16 ට වැඩි ස්ත්‍රී දූෂණ 345; වින්දිතයාගේ කැමැත්ත සහිත ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ 1199; වින්දිතයාගේ කැමැත්ත රහිත ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ 248; සහ අස්වාභාවික වැරදි / බරපතල ලිංගික අපයෝජන 749 කි.[54] 2017 වසරේ මෙම සංඛ්‍යා ලේඛණ පිළිවෙළින් 294; 1206; 232; සහ 616 ලෙස වේ. "දූෂණය / ව්‍යභිචාරය" සහ "අස්වාභාවික වැරදි / බරපතල ලිංගික අපයෝජන" යන සියල්ලම ඇතුළත් වු වර්ගීකරණ යටතේ ලිංගිකමය වැරදි වාර්තා කිරීම වෙනස් වී ඇත. වාර්තාගත සංඛ්‍යාව වැඩි වුවද, ලිංගිකත්වය මත පදනම්ව දත්ත වෙන් නොකිරීම නිසා අපරාධ ප්‍රවණතාවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් හඳුනා ගැනීම අපහැදිලිවන අතර, එසේ තිබුණේ නම් එවැනි අපරාධ වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සියුම් වෙනස්කම් අනාවරණය කර ගත හැකිව තිබුණි.

ශ්‍රී ලංකාවේ ලිංගිකමය වැරදි මූලික වශයෙන් නියම කරන්නේ 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය මගිනි. එහි 363 සිට 365 දක්වාවන වගන්ති, වරදක් හටගැනීම, එහි මූලිකාංග සහ ඊට අදාල දඬුවම් නියම කරයි. 363 වන වගන්තිය මගින් ස්ත්‍රී දූෂණය යන වරදෙහි කොටස් නියම කරන අතර 364 වගන්තිය මගින් ස්ත්‍රී දූෂණය සඳහා වන දඬුවම් නියම කරනු ලබයි.

52 Available at http://hrlibrary.umn.edu/research/srilanka/statutes/Penal_Code.pdf.

53 G.L. Peris, *General principles of Criminal Liability in Ceylon (Sri Lanka) A Comparative Analysis* (Lake House Investments Ltd 1972), 1-9.

54 Crime Division of Sri Lanka Police, 'Grave Crime Abstract for The Year 2018 and 2017 for Whole Island' Available at https://www.police.lk/index.php/crime-trends.

**අර්ථකථනය**

**363. ස්ත්‍රී දූෂණය**

*යම් පිරිමියෙක් පහත විස්තර කර ඇති අවස්ථා අතරින් යම් අවස්ථාවකට, අයත්වන ප්‍රවේශන යටතේ, ස්ත්‍රියක සමග මෛථුනයෙහි යෙදේ නම් එය "ස්ත්‍රී දූෂණය" සිදු කළේ යයි කියනු ලැබේ:-*

*අ) ඒ ස්ත්‍රිය තමාගේ භාර්යාවවන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටිය දී ඇගේ කැමැත්ත නොමැතිව;*
*ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ බියගැන්වීමෙන් හෝ ඇයට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඇය නීති විරෝධී ලෙස රඳවාගෙන සිටිය දී හෝ ඇගේ කැමැත්ත ලබා ගෙන ඇති විට ඇගේ කැමැත්ත ඇතිව;*
*ඇ) ඇය සිහිවිකලව සිටියදී හෝ ඒ පුරුෂයා විසින් නැතහොත් වෙනත් යම් තැනැත්තෙකු විසින් ඇයට දෙන ලද මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඇය සිටිය දී ඇගේ කැමැත්ත ඇතිව;*
*ඈ) තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව ඒ පුරුෂයා දැන සිටි අතර ඇගේ කැමැත්ත දෙන ලද්දේ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී සිටින හෝ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී ඇතැයි ඇය විශ්වාස කරන වෙනත් පුරුෂයෙකු ඒ පුරුෂයා යයි ඇය විශ්වාස කිරීම නිසා බව ඒ පුරුෂයා දන්නා විටක දී ඇගේ කැමැත්ත ඇතිව;*
*ඉ) ස්ත්‍රිය වයස අවුරුදු දොළහට වැඩි වන්නා වූ ද එම පුරුෂයාගේ භාර්යාව වන්නා වූ ද සහ ඇය එම පුරුෂයාගෙන් නීති මගින් වෙන් වී නොමැති නම් මිස, ස්ත්‍රිය වයස අවුරුදු දහසයට අඩු වන විට ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව*

363 වගන්තියට ඇති පැහැදිලි කිරීම "ප්‍රවේශනයේ" අවශ්‍යතාවය යෝනිමය ප්‍රවේශනයේ අවශ්‍යතාවයක් ද යන්න අර්ථ දැක්වීමක් නොකරයි.

*පැහැදිලි කිරීම:*
*(i) ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට අවශ්‍ය මෛථුනය සංයුක්ත වීම සඳහා ප්‍රවේශනය ප්‍රමාණවත් වේ*

කෙසේවෙතත්, එය අධිකරණය නීතිය යෝනිමය ප්‍රවේශනය වීම ලෙස අර්ථ දක්වා ඇත. 2012 තීන්දුවක ප්‍රවේශනය නිර්වචනය කරමින් විනිසුරු රංජිත් සිල්වා ප්‍රකාශ කළේ *"ශුක්‍රානු පිට කිරීම හෝ විදාරණය සහිතව හෝ රහිතව යෝනි තොල් අතර බැලූ බැල්මට අවම වශයෙන් ගමන් කිරීම වැනි යෝනි මුඛය අතර සිදුවන සුළු ප්‍රවේශය මගින් ස්ත්‍රී දූෂණය සිදු වන බවයි. එහි සංසර්ගයේ සම්පූර්ණ ක්‍රියාවක් සිදුවීම අවශ්‍ය නැත. ශිෂ්ණය ඍජු නොවූ විට පවා ස්ත්‍රී දූෂණය සිදු කල හැකිය. කිසිදු තුවාලයක් සිදු නොවී ස්ත්‍රී දූෂණය සිදු විය හැකි අතර එවැනි ඍණාත්මක සාක්ෂි මගින් ස්ත්‍රී දූෂණය බැහැර කරන්නේ නැත".*[55]

දණ්ඩ නීති සංග්‍රහයෙහි ව්‍යභිචාරය වරද 364 අ වගන්තිය මගින් හඳුනා ගන්නා අතර ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය යන්න 363 (ඉ) වගන්තිය මගින් හඳුනා ගනී. එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී විශේෂී සහ එමගින් ප්‍රකාශ කරන්නේ *"ස්ත්‍රිය වයස අවුරුදු දොළහට වැඩි වන්නා වූ ද එම පුරුෂයාගේ භාර්යාව වන්නා වූ ද සහ ඇය එම පුරුෂයාගෙන් නීති මගින් වෙන් වී නොමැති නම් මිස, ස්ත්‍රිය වයස අවුරුදු දහසයට අඩු වන විට ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව"* යම් පුද්ගලයෙකු ස්ත්‍රියක් සමග ලිංගික සංසර්ගයක් කර ඇති විට ස්ත්‍රී දූෂණයක් සිදු කර ඇති බවයි.

[55] *Perera vs. Attorney General* (2012) 1 SLR 69.

## අස්වාභාවික වැරදි සහ බරපතල ලිංගික අපයෝජන පිළිබඳව 365 වැනි වගන්තිය

365 වගන්තිය මගින් "අස්වාභාවික වැරදි" යන්න අපරාධයක් සේ සළකයි. 365 (අ) වගන්තිය මගින් තැනැත්තන් අතර "දැඩි අශිෂ්ඨ ක්‍රියා" අපරාධයක් සේ සළකනු ලබන අතර 365 (ආ) වගන්තිය මගින් "බරපතල ලිංගික අපයෝජන" අපරාධයක් සේ සළකනු ලබයි. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන පනත මගින් මෙම වගන්ති සංශෝධනය කරන ලදී. එමෙන්ම 1998 අංක 29 දරන සංශෝධන පනත මගින් 363 සහ 363 (ආ) යන වගන්තිවලට තව දුරටත් සුළු වෙනස්කම් සිදු කරන ලදී. 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන පනතේ 364, 365, 365 (අ) සහ 365 (ආ) යන වගන්ති පැහැදිලි කරන්නේ "හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනද ඇතුළත් වේ යන්නයි. මෙම වගන්ති ත්‍රිත්වයම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබද අපක්ෂපාතීවන අතරම ඉහත ලිංගිකමය හැසිරීම අපරාධකරුගේ/කරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය නොසළකා අපරාධයක් සේ සළකයි.

365 වැනි වගන්තිය මගින් "යම් පුරුෂයකු, ස්ත්‍රියක හෝ සතෙකු සමග ස්වභාවධර්මයට විරුද්ධව, කැමැත්තෙන් ම කාමුක සංසර්ගයෙහි යෙදීම" අපරාධයක් සේ සළකයි. 365 (අ) වගන්තියෙන් දක්වන්නේ ප්‍රසිද්ධයේ හෝ අප්‍රසිද්ධයේ වෙනත් තැනැත්තෙකු සමග යම් දැඩි අශිෂ්ඨ ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශවකරුවකුවන හෝ, එබඳු යම් ක්‍රියාවක් යම් තැනැත්තෙකු විසින් කරනු ලැබීම කුට්ටනය කරන ලබන හෝ කුට්ටනය කිරීමට තැත් කිරීමට තැත්කරන කවර හෝ තැනැත්තෙකු වරදකට වරදකරුවකු වන බවයි.

365 (ආ) වගන්තියෙන් දක්වන්නේ ඕනෑම බරපතල ලිංගික අපයෝජනයක් පහත ආකාරයන්ගෙන් සිදු වුවහොත් එය ස්ත්‍රී දූෂණයක් ලෙස ගණන් නොගෙන බරපතල ලිංගික අපයෝජනයක් ලෙස ගණන් ගැනෙන බවයි.

1. කැමැත්ත නොමැතිව
2. බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන්, මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇතිකිරීමෙන් හෝ නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටියදී හෝ ලබා ගත් කැමැත්ත සහිතව
3. සිහිවිකලව සිටියදී හෝ මද්‍යසාර නැතහොත් මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් වූ අවස්ථාවක ලබාගත් කැමැත්ත සහිතව

මෑතකදී ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද අභියාචනයකදී 365 (අ) වගන්තියෙහි එන තැනැත්තන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා යටතේ එන දඬුවම් සම්බන්ධයෙන් සළකා බලන ලදී. නඩුවේ සිද්ධිමය කරුණු සැකෙවින් දක්වන්නේ නම් සාක්ෂිකරුවෙක් වාහනයක් තුල දී පුරුෂයින් දෙදෙනෙකු මුඛ සංසර්ගය කරමින් සිටින බව පොලිස් නිලධාරියෙකු වෙත වාර්තා කරන ලද අතර එතනට පැමිණි එම පොලිස් නිළධාරියා ද එම සිද්ධිය දකින ලදී. අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කල කරුණු වල සාක්ෂිමය වටිනාකම සහ සම්භාවිතාවයන් සලකා බැලීමෙන් පසුව විනිසුරුවරුන් විසින් වසර දෙකකට අත්හිටුවන ලද බරපතල සිර දඬුවම් නඩුවේ තත්ත්ව සළකා බලා නියම කරන ලදී. විනිසුරු අලුවිහාරේ විසින් වැඩිහිටියන් අතර ලිංගිකත්වයේ පැතිකඩ පිළිබඳව අදහස් දක්වමින් පහත සඳහන් පරිදි අදහස් දක්වන ලදී.

*"සමකාලීන චින්තනයට අනුව ,රජය විසින් වැඩිහිටියන් දෙදෙනෙකු අතර එකගතාවය මත ඇති වන ලිංගික ක්‍රියා සම්බන්ධයෙන් නීති මාර්ගයෙන් කටයුතු නොකළ යුතු අතර එය අපරාධයක් සේ සැලකීමට කාරණයක් නොවිය යුතුය යන්න වසර ගණනාවක් තිස්සේ වර්ධනය වූවකි. සමහරවිට එය එංගලන්තයේ පුංමෛථුනය සහ ගුද මෛථුනය යන වරද අවලංගු කිරීමට ද මූලික වූ තර්කය වන්නට ඇත. කෙසේ නමුත් මෙම වරද අප නීතියේ කොටසක් ලෙස බොහෝ විට පවතී."*[56]

[56] *OIC Maradana v. Galabada Payagalage Sanath Wimalasiri*, SC Appeal No 32/2011, 11-12 Available at http://www.supremecourt.lk/images/documents/sc_appeal_32_11.pdf.

## දඬුවම් නියම කිරීම

1995 අංක 22 දරන සංශෝධන පනතේ 364 වැනි වගන්තියට අනුව ස්ත්‍රී දූෂණය සඳහා දැඩි දඬුවම් පමුණුවයි. දඬුවම් ලෙස අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන බරපතල වැඩ සහිතව බන්ධනාගාරගත කිරීමත් සමග දඩයකට යටත් කිරීමත් වින්දිතයාට වන්දියක් ගෙවීමත් එම වගන්තිය මගින් නියම කරනු ලබයි.

තවද,

(අ) රජයේ නිලධාරියෙකුව හෝ බලය ඇති තත්ත්වයන් දරන තැනැත්තෙකුව සිටිමින් තමාගේ නිල තත්ත්වය ප්‍රයෝජනයට ගෙන තමාගේ නිල රැකවරණයෙහි සිටින ස්ත්‍රියක් දූෂණය කළහොත් හෝ අයුතු ලෙස අවහිර කර ස්ත්‍රියක් දූෂණය කළහොත්

(ආ) රක්ෂණ නිවාසයක හෝ අත්අඩංගුවේ තබා ගන්නා වෙනත් ස්ථානයක නැතහොත් කාන්තා හෝ ළමා ආයතනයක කළමණාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියතු තැනැත්තෙකු වෙමින් සිටිය දී

(ඇ) රෝහලක කළමණාකරණ පක්ෂයේ හෝ කාර්යය මණ්ඩලයේ නියතු තැනැත්තෙකුව සිටියදී

(ඈ) ගර්භණී ස්ත්‍රියක් දූෂණය කළහොත්

(ඉ) වයස අවුරුදු 18 ට වඩා අඩු ස්ත්‍රියක් දූෂණය කළහොත්

(ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කළහොත්

(උ) රංචු ගැසී ස්ත්‍රී දූෂණය කළහොත්

එම වරදවල් සඳහා අවුරුදු දහයකට නොඅඩු අවුරුදු විස්සක් නොඉක්මවන දැඩි දඬුවම් පමුණුවනු ලබයි.

365 (අ) වගන්තියෙහි එන තැනැත්තන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා සහ 365 (ආ) වගන්තිය යටතේ එන බරපතල ලිංගික අපයෝජන ක්‍රියා දෙකටම අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සට නොඉක්මවන බරපතල සිර දඬුවම්, දඩ නියම කිරීම් සහ වන්දි ගෙවීම් නියම කරනු ලබයි. මෙය ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පනවන ලද උග්‍ර දඬුවම්වලට සමාන වේ.

# ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ නිරීක්ෂණ

මෙම ලියවිල්ලෙහි අවසාන කොටස ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණයට අදාළ නීතිවල නිරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් හඳුනා ගනී. සොයාගැනීම් සහ නීති පිළිබඳ සාකච්ඡා මත පදනම්ව, මෙම කොටස ශ්‍රී ලංකාවේ ලිංගික වැරදි සම්බන්ධයෙන් උපදේශනය සහ නීති ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රධාන කරුණු හඳුනා ගනී. මෙම කරුණු ලිංගික වැරදි පිළිබඳ වර්තමාන කතිකා සහ ඉහත සාකච්ඡා කර ඇති රටවල සංසන්දනාත්මක අවබෝධයෙන් ආභාෂය ලබා ඇත.

ශ්‍රී ලංකාවේ පවත්නා නීති සංශෝධනය කළ හැක්කේ පාර්ලිමේන්තුවට පමණි. නීතියක් පැනවීමෙන් පසුව එය මූලික අයිතිවාසිකම් කරනවිට, එහි ව්‍යවස්ථානුකූලභාවය තීරණය කිරීමට අධිකරණයට බලය ඇති ඉන්දියාවේ මෙන් නොව, ශ්‍රී ලංකාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිවම පශ්චාත් අධිකරණ පුනරීක්ෂණය වළක්වනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සපයන්නේ පූර්ව අධිකරණ පුනරීක්ෂණයන් පමණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(3) වැනි වගන්තියෙහි දැක්වෙන්නේ, ජනාධිපතිවරයාගේ හෝ කථානායකවරයාගේ සහතිකය මත පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් වූ පසු, *"කිසිම අධිකරණයකින් හෝ විනිශ්චය සභාවක් විසින් කිසියම් පදනමක් මත එවැනි පනතේ වලංගුභාවය පිළිබඳව විමර්ශනය කිරීම, ප්‍රකාශ කිරීම හෝ කිසිදු ආකාරයකින් ප්‍රශ්න කිරීමක් නොකළ යුතුය"* යනුවෙනි. මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තියේ සඳහන් වන්නේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සමග කිසියම් නොගැළපීමක් තිබියදීත්, පවත්නා සියලුම ලිඛිත නීති සහ අලිඛිත නීති වලංගු හා ක්‍රියාත්මක විය යුතු බවයි.

**ස්ත්‍රී දූෂණය අර්ථ දැක්වීම**

ස්ත්‍රී දූෂණය පිළිබඳ වරද 'කැමැත්ත' යන්න මූලිකකොට ගනිමින් ප්‍රති-අර්ථකථනය කළ යුතුය. ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය "ස්ත්‍රිය, වචන, අභිනයන් හෝ ඕනෑම ආකාරයක වාචික හෝ වාචික නොවන සන්නිවේදනයක් මගින් නිශ්චිත ලිංගික ක්‍රියාවකට සහභාගී වීමට කැමැත්ත ප්‍රකාශ කරන විට එය ස්වේච්ඡා එකඟතාවයක්" ලෙස අර්ථ දක්වයි. කැමැත්ත සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයට හේතුවන භාෂාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුය. එවැනි කැමැත්තක් ලබා දීමේ හැකියාව තිබියදී දැනුවත්ව හා ක්‍රියාකාරී තීරණයක් ලෙස කැමැත්ත යන්න අර්ථකථනය කළ යුතුය.

කැමැත්ත කේන්ද්‍රීයවන විට, බලහත්කාරයෙන් ප්‍රවේශනය යනු යෝනිය, මුඛය හෝ ගුදයද, හෝ නැතහොත් එවැනි ප්‍රවේශනයක් පුරුෂ ලිංගයක්, ශරීරයේ කොටසක් හෝ වස්තුවක් භාවිතයෙන් සිදු වී ඇතිද යන්න අදාළ නොවේ. ලිංගික ස්වභාවයක් ආක්‍රමණය කිරීම සෑම අවස්ථාවකම ශාරීරික ස්වාධීනත්වය උල්ලංඝනය කරයි. එබැවින් ස්ත්‍රී දූෂණය පිළිබඳ අර්ථ දැක්වීම ගුදය හා මුඛය ප්‍රවේශ වීම දක්වාත්, ශරීරයේ කොටසක් හෝ වස්තුවක් ප්‍රවේශනය වීම දක්වාත් ලෙස පුළුල් විය යුතුය.

"ස්ත්‍රී දූෂණය" යටතේ ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයෙහි ලැයිස්තුගත කර ඇති බලාත්ප්‍රවේශන (intrusions) වර්ග ආවර්ජණය කර ගැනීම මෙහිදී ප්‍රයෝජණවත්වනු ඇතඃ

**2013 අංක 13 දරණ අපරාධ නීතිය (සංශෝධන) පනත මගින් සංශෝධිත ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයෙහි 375 වන වගන්තිය**

375. පුරුෂයෙකු "ස්ත්‍රී දූෂණය" ට සම්බන්ධ වේ නම් ඔහු-

(a) ස්ත්‍රියකගේ යෝනි මාර්ගය, මුඛය, මුත්‍ර මාර්ගය හෝ ගුදය තුළට ඔහුගේ ශිෂ්ණය ප්‍රවේශනය කිරීම හෝ ඔහු හෝ වෙනත් පුද්ගලයෙකු සමග එසේ කිරීමට ඇයව පොළඹවයි; හෝ

(b) ශිෂ්ණය පමණක් නොව, යෝනි මාර්ගයට, මුත්‍රා මාර්ගයට හෝ ගුදය තුළට හෝ ශරීරයේ ඕනෑම වස්තුවක් හෝ කොටසක් ඇතුල් කිරීම හෝ ඔහු හෝ වෙනත් පුද්ගලයෙකු සමග එසේ කිරීමට ඇයව පොළඹවයි; හෝ

(c) යෝනි මාර්ගය, මුත්‍රා මාර්ගය, ගුදය හෝ එවැනි කාන්තාවකගේ ශරීරයේ ඕනෑම කොටසකට ප්‍රවේශනය වීමට හේතු වන පරිදි ස්ත්‍රියකගේ ශරීරයේ ඕනෑම කොටසක් හැසිරවීම හෝ ඔහු හෝ වෙනත් පුද්ගලයෙකු සමග එසේ කිරීමට ඇයව පොළඹවයි; හෝ

(d) ස්ත්‍රියකගේ යෝනි මාර්ගය, ගුදය, මුත්‍රාශයට ඔහුගේ මුඛය යෙදීම හෝ ඔහු හෝ වෙනත් පුද්ගලයෙකු සමග එසේ කිරීමට ඇයව පොළඹවයි

## විවාහය තුළ ස්ත්‍රී දූෂණය

විවාහය තුළ ස්ත්‍රීන්ට එරෙහිව සිදුවන ලිංගික බලහත්කාරය ශ්‍රී ලංකාවේ වරදක් ලෙස හඳුනාගෙන නොමැත. 1995 දණ්ඩ නීති සංග්‍රහයෙහි සංශෝධනය,[57] දැනුවත්ව හෝ නොදැනුවත්වම, 363 (අ) වගන්තියේ අර්ථ නිරූපණය තුළින් වෛවාහික දූෂණය යන්න අපරාධ ගණයෙහි ලා නොසළකයි. 363 (අ) වගන්තියේ සඳහන් වන්නේ පුරුෂයෙකු ස්ත්‍රී දූෂණයක් සිදු කරන්නේ *"එවැනි ස්ත්‍රියක් ඔහුගේ බිරිඳවන අතර ඇය අධිකරණමය වශයෙන් පුරුෂයාගෙන් වෙන්ව සිටින තැනක පවා ඇයගේ කැමැත්තෙන් තොරව"* ස්ත්‍රියක් සමග ලිංගික සංසර්ගයෙහි යෙදීමෙනි යනුවෙනි. මෙය සාකච්ඡා කළ යුතුය.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අපක්ෂපාති වූ ස්ත්‍රී දූෂණ නීති පිළිබඳ ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ට එරෙහි ලිංගික බලහත්කාරයට අදාළ නීති ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ මධ්‍යස්ථ නොවන අතර එය ආවරණය කරන්නේ පිරිමියෙකු විසින් ස්ත්‍රියකට එරෙහිව ලිංගික බලහත්කාරය සිදුකොට ඇති අවස්ථා පමණි. පුරුෂයෙකුට එරෙහිව දූෂණය සිදු කරන පුරුෂයෙකුට හෝ දූෂණය කරන ස්ත්‍රියකට 365 (ආ) වගන්තිය යටතේ ඇති බරපතල ලිංගික අපයෝජනය යටතේ නඩු පවරනු ලැබේ. පවත්නා ස්ත්‍රී දූෂණ නීති මගින් ලිංගික හිංසනය සිදුවිය හැකි බොහෝ ආකාර, එනම් ශිෂ්ණය ගුද සහ මුඛ ප්‍රවේශනය වීම සහ යෝනි මාර්ගය, ගුදය හෝ මුඛය ශරීරයේ කොටසක් හෝ වස්තුවක් ප්‍රවේශනය වීම සිදුවිය හැකි බව දක්වා ඇත. එසේම, මෙම නීතිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී යුගලයට **(Gender Binary)** එහා ගිය ලිංගික හිංසනය සම්බන්ධයෙන්වන තේරුම් ගැනීමක් වළක්වයි. එබැවින්, ශ්‍රී ලංකාවේ, සංක්‍රාන්ති පුරුෂයෙකු හෝ සංක්‍රාන්ති ස්ත්‍රියක් දූෂණය කිරීම, ස්ත්‍රී දූෂණය යන්න නිර්වචනය කරන 363 වැනි වගන්තියේ විෂය පථයට පිටින් වැටෙන අතර, එම ක්‍රියාව 365 (ආ) වගන්තියේ "බරපතල ලිංගික අපයෝජනය" යන ගණයට වැටේ. මෙයින් 'ස්ත්‍රියක්' ඇරෙන්නට වෙනත් කෙනෙකුට එරෙහිව සිදු වී ඇති විට සහ ස්ත්‍රී දූෂණයේ වෙනත් මූලාංග තහවුරු කළ හැකි විට පවා ස්ත්‍රී දූෂණයක් ලෙස පිළිගැනීමට ඇති අකමැත්ත ඇඟවේ.

---

[57] Available at http://www.hrcsl.lk/PFF/LIbrary_Domestic_Laws/Legislations_related_to_Employment/Penal%20Code%20(Amendment)%20Act%20No%2022%20of%201995.pdf.

මාලදිවයිනේ, දණ්ඩ නීති සංග්‍රහයෙහි 130 වැනි වගන්තියේ ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ අපක්ෂග්‍රාහී භාෂාව "ලිංගික අඩන්තේට්ටම්" වරද යටතේ ස්ත්‍රී දූෂණය අපරාධ ගණයෙහි ලා සැළකීමට යොදා ගනී. "නීති විරෝධී ලිංගික සංසර්ගය" මෙම වරදට මූලික වේ. දණ්ඩ නීති සංග්‍රහයෙහි 411 (f) වගන්තියෙන් පැහැදිලි වන්නේ "නීති විරෝධී ලිංගික සංසර්ගය" "මද වශයෙන් හෝ පුරුෂයෙකු ඔහුගේ ශිෂ්ණය යෝනි මාර්ගයට ඇතුළු කිරීම" ලෙස විය යුතුය යන්නයි. "සමලිංගික සංසර්ගය" යනු ඔහුගේ ශිෂ්ණය පුරුෂයෙකු විසින් තවත් පුරුෂයෙකුගේ ගුදය හෝ මුඛය තුළට ඇතුළු කිරීම, හෝ වෙනත් පිරිමියෙකුගේ වස්තුවක් ගුදයට ඇතුළු කිරීම, සහ ස්ත්‍රියකගේ අවයවයක් හෝ කිසියම් වස්තුවක් වෙනත් ස්ත්‍රියකගේ යෝනි මාර්ගය හෝ ගුදයට ස්ත්‍රියක් විසින් ඇතුළු කිරීමය. මෙසේ මාලදිවයිනේ දණ්ඩ නීති සංග්‍රහයෙහි 130 වගන්තිය විවිධාකාර ස්ත්‍රී දූෂණ සිද්ධීන් ආවරණය කරන නමුත් ස්ත්‍රියක් පිරිමියෙකුගේ ප්‍රවේශය සඳහා බල කළ හැකි තත්වයක් මෙහි විෂය පථයෙන් බැහැර වේ.

ස්ත්‍රී දූෂණයට අදාළ නීතිය ස්ත්‍රීන්ගේ ආරක්ෂාව සඳහා සීමා කිරීම යුක්තිසහගත නොවන 'ද්විත්ව ප්‍රමිතියක්'[58] යැයි තර්ක කර ඇත. ස්ත්‍රීන් හා ගැහැණු ළමයින් දූෂණය කිරීම, පිරිමින් සහ පිරිමි ළමයින් දූෂණය කිරීමට වඩා නිතර සිදුවන බව වාර්තාවලින් පෙන්වා දුන්නද, දූෂණය යන්න පිරිමින්ට එරෙහිව සිදු නොවන බවට බැහැර කළ නොහැකිය. ස්ත්‍රී දූෂණය ලෙස වරද හඳුනා ගැනීමෙන් වින්දිතයාට අවශ්‍ය නීතිමය රැකවරණය සහ වැරදිකරුට ද දඬුවම් දීමද වැඩිකොට ඇත. එක්සත් රාජධානියේ 2017 කළ අධ්‍යයනයකින් ස්ත්‍රී වරදකාරියක[59] විසින් "ප්‍රවේශනය සඳහා බල කරන ලද" පුරුෂයින්ගේ අත්දැකීම් විශ්ලේෂණයකොට ඇත. නමුත් එක්සත් රාජධානියේ පවා ස්ත්‍රී දූෂණයට අදාළ නීති දිවි ගලවා ගත් පුරුෂයින්ව බැහැර කරයි: 2003 එක්සත් රාජධානියේ ලිංගික අපරාධ පනතේ[60] 1 වැනි වගන්තියෙහි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ මධ්‍යස්ථ පාරිභාෂිතය භාවිතා කළද, පැහැදිලි කිරීමේ සටහන් මගින් "ස්ත්‍රී දූෂණය" එය "ශිෂ්ණය ප්‍රවේශනය වීම" හා සම්බන්ධ නිසා සිදු එය කළ හැක්කේ පුරුෂයෙකුට පමණි යන්න දක්වා ඇත.[61]

පුරුෂයෙකුට එරෙහි දූෂණය ඇතුළත් කිරීම සඳහා 'ස්ත්‍රී දූෂණය' යන්නෙහි අර්ථ දැක්වීම දීර්ඝ කරන ලෙස ඉල්ලීම් තිබේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථ ස්ත්‍රී දූෂණ නීති යෝජනා කරන පනතක් මෑතකදී ඉන්දියාවේදී ඉදිරිපත් විය.[62] 2012 දී ඉන්දියාවේ අපරාධ නීතිය සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පතක්[63] මගින් ස්ත්‍රී දූෂණය පිළිබඳව විධිවිධාන පහත පරිදි ප්‍රතිස්ථාපනය කිරීමට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථ ප්‍රතිපාදනයක් යෝජනා කරන ලදී:

58 Natasha McKeever, "Can a Woman Rape a Man and Why Does It Matter?", Criminal Law and Philosophy (2018 Springer) Available athttps://link.springer.com/content/pdf/10.1007%2Fs11572-018-9485-6.pdf.

59 Dr. Siobhan Weare, Forced-to-penetrate Cases: Lived Experience of Men (2017 Lancaster University) Available at https://wp.lancs.ac.uk/forced-to-penetrate-cases/files/2016/11/Project-Report-Final.pdf.

60 Available at http://www.legislation.gov.uk/ukpga/2003/42/contents.

61 බලන්න http://www.legislation.gov.uk/ukpga/2003/42/notes/division/5/1/1.

62 TIMESOFINDIA.COM "Bill in Parliament to make sexual crimes gender neutral: Read Full Text" 13/07/2019 Available at https://timesofindia.indiatimes.com/india/kts-tulsi-introduces-bill-in-rajya-sabha-to-make-sexual-crimes-gender-neutral-full-text-of-the-bill/articleshow/70202016.cms.

63 Available at https://www.prsindia.org/sites/default/files/bill_files/Criminal_Law_%28A%29_bill%2C_2012.pdf.

"375. පුද්ගලයෙකු "ලිංගික අතවර" සිදු කරනු ඇතැයි කියනු ලබන්නේ නම්, එම පුද්ගලයා-

(a) ලිංගික අරමුණක් සඳහා වෙනත් පුද්ගලයෙකුගේ යෝනි මාර්ගය, ගුදය හෝ මුත්‍ර හෝ මුඛය ප්‍රවේශනය-
   (i) එවැනි පුද්ගලයකුගේ ශිෂ්ණය ඇතුළුව ශරීරයේ ඕනෑම කොටසක්; හෝ
   (ii) එවැනි පුද්ගලයකු විසින් හසුරුවන ලද කිසියම් වස්තුවක්, නිසි සනීපාරක්ෂක හෝ වෛද්‍යමය අරමුණු සඳහා එවැනි ප්‍රවේශනයක් සිදු කළහොත් හැර;
(b) අනෙක් පුද්ගලයාගේ ශරීරයේ ඕනෑම කොටසක් මගින් යෝනි මාර්ගය හෝ ගුදය හෝ මුත්‍රා හෝ මුඛය ප්‍රවේශනයට හේතු වන පරිදි වෙනත් පුද්ගලයෙකුගේ ශරීරයේ ඕනෑම කොටසක් හැසිරවීම;

(c) "ස්ත්‍රීන්ගේ ලිංගේන්ද්‍රය දිවෙන් හෝ තොල් භාවිතයෙන් උත්තේජනය කිරීම" හෝ "පුරුෂ ලිංගේන්ද්‍රය මුඛයෙන් උත්තේජනය" කිරීමෙහි නිරත වේ,

ඉහත කී විස්තර භයෙන් එකක් යටතට ගැනෙන තත්වයන් යටතේ..."[64] කැනඩාව සහ දකුණු අප්‍රිකාව ස්ත්‍රී දූෂණ නීති සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවී මධ්‍යස්ථ ප්‍රවේශයක් භාවිතා කරන අතර, කැනඩාව "ලිංගික මැදිහත්වීම"[65] වරද යන පුළුල් යෙදුම භාවිතා කරන අතර දකුණු අප්‍රිකාව "ස්ත්‍රී දූෂණය"[66] යන යෙදුම එලෙසම පවත්වාගෙන යයි.

දකුණු අප්‍රිකානු නීතිය, ස්ත්‍රී දූෂණය පහත පරිදි අර්ථ දක්වයි.

**247 වැනි වගන්තිය - ස්ත්‍රී දූෂණය**

(1) කවුරුන් හෝ, වෙනත් පුද්ගලයෙකු සමඟ ඔහුගේ හෝ ඇයගේ කැමැත්තට අනුව හෝ ඔහුගේ හෝ ඇයගේ කැමැත්තෙන් තොරව ලිංගික සංසර්ගය හෝ කාම සංසර්ගයෙහි යෙදී සිටී නම් දූෂණය කිරීමේ වරද සිදු කරන අතර වසර දහහතරකට නොවැඩි කාලයක් සඳහා සිරදඬුවමක් නියම කළ යුතු අතර දඩයකට යටත් විය හැකිය.[67]

මෙම නීතිය යටතේ, පුරුෂයින්ට එරෙහිව දූෂණය සිදුකරන පුරුෂයින් මෙන්ම ස්ත්‍රීන්ට එරෙහිව දූෂණය සිදුකරන ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට එරෙහිව නඩු පැවරීමට ඔවුන් යටත් වේ. ඇත්ත වශයෙන්ම, දකුණු අප්‍රිකාවේ ප්‍රවෘත්ති වාර්තා අනුව මෙම නීතිය යටතේ පුරුෂයෙකු දූෂණය කිරීම සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට එරෙහිව චෝදනා ගොනු කර තිබේ.[68]

---

64 5 වැනි වගන්තිය The Criminal Law (Amendment) Bill 2012 Available at https://www.prsindia.org/sites/default/files/bill_files/Criminal_Law_%28A%29_bill%2C_2012.pdf.

65 S.151 of Criminal Code of Canada https://laws-lois.justice.gc.ca/eng/acts/c-46/page-34.html#h-118150.

66 A discussion on using the term 'sexual assault' instead of 'rape' can be found in the Report of the Committee on Amendments to Criminal Law 'Justice Verma Committee' (2013) Available at https://www.prsindia.org/uploads/media/Justice%20verma%20committee/js%20verma%20committe%20report.pdf.

67 Available at https://www.wipo.int/edocs/lexdocs/laws/en/ss/ss014en.pdf

68 බලන්න news reports at https://www.independent.co.uk/news/world/africa/three-women-kidnap-man-rape-him-and-steal-his-semen-in-south-africa-10233198.html, https://www.thesun.co.uk/news/3673560/three-women-rape-man-23-for-three-days-after-kidnapping-man-in-a-taxi-and-force-feeding-him-energy-drinks-in-south-africa/, and http://www.sabcnews.com/sabcnews/30-year-old-woman-sentenced-for-raping-boy-10/

එකම විධිවිධානය යටතේ සියලුම මිනිසුන්, පුරුෂයින්ට, ස්ත්‍රීන්ට, සංක්‍රාන්ති ලිංගිකයින්ට සහ ස්ත්‍රී හෝ පුරුෂ හෝ යන දෙකටම අයිති නැති (non-binary) පුද්ගලයින්ට ලිංගික හිංසනයෙන් ආරක්ෂා වීමට න්‍යායට අනුව හැකිය.

කෙසේවෙතත්, ස්ත්‍රී හෝ පුරුෂ හෝ යන දෙකටම අයිති නැති ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය යුගලය (gender binary ) ඉක්මවා යන නීති සම්මත කිරීම වැදගත් වන අතර, එවැනි නීති මගින් ස්ත්‍රීන්ට අවාසියක් සිදුවනු ඇත්ද යන ප්‍රශ්නය තවමත් පවතී. ස්ත්‍රී දූෂණයට අදාළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ නිශ්චිත නීති පැවතියද, ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ට එරෙහි දූෂණ සම්බන්ධයෙන් සුවිශේෂී දඬුවම් නොලැබෙන බව අධ්‍යයනවලින් යෝජනාකොට ඇත.[69] මේ අතර, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණ පිළිබඳ වාර්තා වූ තීන්දු වලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පක්ෂපාතීත්ව නිරීක්ෂණය වී ඇත.[70] පළමුව එය කැමැත්ත පිළිබඳ දුර්වල අවබෝධයට ලක් වී ඇති අතර, දෙවනුව එය යුක්තිය අපේක්ෂා කරන විට ස්ත්‍රීන්ට සැළකිය යුතු ලෙස වෙනස් කොට සළකයි.

එවිට, ස්ත්‍රීන්ට එරෙහි දූෂණ සඳහා පුරුෂයින්ට සුවිශේෂී මුක්තියක් ලබා දෙන අධිකරණ පද්ධතියක ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අපක්ෂපාතී ස්ත්‍රී දූෂණ නීතියක් සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රීන්ට අවාසි සහගත තත්ත්වයක් ඇති කරන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පක්ෂපාතීත්වය සහ ඒකාකෘති වලට ඉඩ දෙන්නේද යන ගැටලුව පැන නගී. එහිදී බොරු චෝදනාවලට පුරුෂයින්ට අවස්ථාව ලබා දීමෙන් ස්ත්‍රීන් තවදුරටත් පීඩාවට පත් කරනු ඇත. පීතෘමූලික සමාජයක් තුළ ඇති චෝදනාත්මක අධිකරණ පද්ධතියක් තුළ ස්ත්‍රීන්ට තමන් ගොදුරු වූ බව ඔප්පු කිරීමට අපහසු නම්, ස්ත්‍රියකට තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීම කෙතරම් දුෂ්කර ද?

එබැවින්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අපක්ෂපාතී ස්ත්‍රී දූෂණ පිළිබඳ නීති සඳහා ශ්‍රී ලංකාව තවමත් සූදානම් නැති බව යථාර්ථය තුළ නිගමනය කළ හැකිය. තීන්දුවල ඇති භාෂාවෙන් ස්ත්‍රීන්ට සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පක්ෂපාත්තීත්වයට එරෙහිව වෙනස්කොට සළකන නීතිවල පැවැත්ම, අධිකරණ පද්ධතියට ඇති පීතෘමූලකත්වයේ බලපෑම පෙන්වා දෙයි. අධිකරණ පද්ධතියට ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ඒකගෘහිකතාවය ඉක්මවා ගොස් පුරුෂයින්, ස්ත්‍රීන් සහ අනෙක් සියල්ලන්ම එක හා සමාන යැයි හඳුනා ගන්නා තෙක් එවැනි නීතියක් මගින් දැනටමත් අනර්ථයක සිටින අයවලුන් ඊටත් වඩා අනර්ථකාරී තත්වයකට පත් කරනු ඇත.

විනිසුරු වර්මා කොමිසම, සැළකිය යුතු සමානාත්මතාවයේ අවශ්‍යතාවය හඳුනාගනිමින් ප්‍රකාශ කරන්නේ *"හුදෙක් අලංකෘත ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මධ්‍යස්ථ නීති සහ ප්‍රතිපත්ති මගින් සංජානනීය (අන්තර් දෘෂ්ටියෙන් සහ බුද්ධියෙන්) ලෙස හැඳින්වෙන දේ ප්‍රතික්ෂේප කළ නොහැකි බව අපගේ මතයයි. "..... යුක්තිය සඳහා වෙනස් වූ ප්‍රවේශයට මුහුණ දෙන ස්ත්‍රීන් නීති පද්ධතිය සමග සම්බන්ධ වීමට අපේක්ෂා කරයි....." යනුවෙන් දක්වයි.*

### පුරුෂයන් සහ සංක්‍රාන්ති ලිංගිකයන් දූෂණයෙන් ආරක්ෂා කිරීම

ස්ත්‍රී දූෂණයට අදාළ නීති පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ වින්දිතයාගේ ලිංගභේදය මත පදනම්ව ද දඬුවම්වල සුළු වෙනස්කම් ඇති බවයි. ස්ත්‍රියක් හැර වෙනත් කෙනෙකුට එරෙහිව දූෂණය කළ බවට චෝදනා ලැබූ පුද්ගලයෙකුට 365 (ආ) යටතේ නඩු පවරනු ලැබේ. මෙම වගන්තිය යටතේ වරදකරු කිරීම මත පනවා ඇති දඬුවම්, ස්ත්‍රියකට එරෙහි දූෂණය සම්බන්ධව 364 වැනි වගන්තියෙහි පනවා ඇති දඬුවම්වලට වඩා වෙනස් වේ.

[69] Shenali de Silva, A Snapshot of the Criminal Justice System: Building a Picture Through Sexual Violence Cases in the Court of Appeal (2018 Law and Society Trust) Available athttps://www.lstlanka.org/wp-content/uploads/2018/04/LST_CJS_REPORT_230418.pdf

[70] SandaniAbeywardene, 'Images, myths and Stereotypes: A Critical Discourse Analysis of the Construction of the 'female' in Judicial Pronouncements on Rape in Sri Lanka', 37-44, LST Review: Queering the Law, https://www.forum-asia.org/uploads/wp/2017/03/LST-Review-Queering-the-Law-Dec-2016.pdf

| ස්ත්‍රියකට එරෙහි දූෂණය | | පුරුෂයෙකුට හෝ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙකුට එරෙහි දූෂණය | |
|---|---|---|---|
| **වගන්තිය** | **දඬුවම** | **වගන්තිය** | **දඬුවම** |
| 363 වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය සඳහා 364 (1) | අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු අතර විනිශ්චයකරු විසින් නියම කරන දඩය සහ වන්දි මුදල | 365 ආ (2) (අ) | අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු අතර විනිශ්චයකරු විසින් නියම කරන දඩය සහ වන්දි මුදල |
| 364 (2) (ඉ) වයස අවුරුදු දහඅටට අඩු ස්ත්‍රියක් දූෂණය | අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු අතර විනිශ්චයකරු විසින් නියම කරන දඩය සහ වන්දි මුදල | 365 ආ (2) (ආ) අවුරුදු දහඅටට අඩු පුද්ගලයෙක් බරපතල ලිංගික අපයෝජනයට ලක් කිරීම | අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු අතර විනිශ්චයකරු විසින් නියම කරන දඩය සහ වන්දි මුදල |
| 364 (2) (අ) රාජ්‍ය නිලධාරියෙකුව සිටිමින් | අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සකට නොවැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු අතර විනිශ්චයකරු විසින් නියම කරන දඩය සහ වන්දි මුදල | මේ හා සමාන බරපතල වැරදි හඳුනාගෙන නැත | |
| 364 (2) (ආ) අත්අඩංගුවට තබාගන්නා ස්ථානයක හෝ ආයතනයක හෝ කළමනාකරණ පක්ෂයේ හෝ කාර්යමණ්ඩලයේ නියුතු තනැත්තෙකුව සිටිමින් | | | |

| | | | |
|---|---|---|---|
| 364 (2) (ඇ) රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්යමණ්ඩලයේ නියුතු තැනැත්තෙකුව සිටිමින් | | | |
| 364 (2) (ඇ) යම් ස්ත්‍රියක් ගර්භණී බව දැන දැනම ඇයව දූෂණය කිරීම | | | |
| 364 (2) (ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කිරීම | | | |
| 364 (2) (උ) රංචු ගැසී දූෂණය කිරීම | | | |

*වගුව 1: ස්ත්‍රීන්ට සහ වෙනත් අයට එරෙහිව දූෂණ සම්බන්ධයෙන් දඬුවම් නියම කිරීම*

පූර්ව නඩු සිද්ධීන් පෙන්නුම් කරන්නේ ස්ත්‍රී දූෂණයකදී ස්ත්‍රීන් වින්දිතයින් ලෙසත් පුරුෂයින් අපරාධකරුවන් ලෙසත් ඒකාකෘති වී ඇති බවයි. *පෙරේරා එදිරිව නීතිපති* [71] නඩුවේදී රංජිත් සිල්වා විනිසුරුවරයා විසින් තරුණියක් පිරිමියෙකු විසින් පැහැරගෙන යාමේ සිද්ධියක් සම්බන්ධයෙන් "ස්වාභාවික උපකල්පනයක්" පෙන්වා දුන්නේය. *"යෞවනයෙකු විසින් විවාහක වයසේ ගැහැණු ළමයෙකු පැහැරගෙන යනු ලැබීමේ ස්වාභාවික උපකල්පනය නම්, ඔහු ඇයව පැහැරගෙන ගොස් ඇත්තේ ඇයව දූෂණය කිරීමෙන් පසුව හෝ ඇයව විවාහ කර ගැනීමෙන් පසුව ලිංගික සංසර්ගයෙහි යෙදීමට ඇයගේ කැමැත්ත ලබා ගැනීමෙන් පසුවය යන්නයි. මෙම උපකල්පනය විකෘති කිරීමට නොහැකි වීමට කිසිදු හේතුවක් මට නොපෙනේ. පිරිමියෙකු ගැහැණු ළමයෙකුව හුදෙකලා ස්ථානයකට ඇද දමා තම ලිංගික අවශ්‍යතා සපුරාගැනීම සඳහා ඇයව අයුතු සිර කර තැබීමක තබන විට එසේ කරන්නේ ලිංගික සංසර්ගයේ යෙදීමේ අරමුණෙනි".* කෙසේ වෙතත්, පුරුෂ වින්දිතයින් සම්බන්ධයෙන් මේ හා සමාන ප්‍රවේශයක් අනුගමනය කර නොමැත.

විශේෂයෙන්ම ලිංගික හිංසනය සම්බන්ධයෙන්, පුරුෂ අනන්‍යතාවය සමග වින්දිතභාවයේ විසංසටනයක් ඇති බව පෙනේ. වින්දිතභාවයට පත්වීම යන්න විශාල වශයෙන් ගවේෂණය නොකරන ලද පුළුල් පර්යේෂණ න්‍යාය පත්‍රයක් වර්ධනය වෙමින් පවතින බව පෙනෙන කලාපයකි.[72] මේ අනුව, පුරුෂයින්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දීම සඳහා වින්දිතභාවයට පත්වීම වටා ඇති ඒකාකෘති අභියෝගයට ලක් කළ යුතුය.

ඒ අතරම, දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් 364 (2) (අ) සිට (උ) දක්වා බරපතල වැරදිවලට සමානව 365 (ආ) වගන්තිය යටතේ බරපතල වැරදි (වරද සිදුවන අවස්ථාවේ පවතින තත්ත්ව නිසා බරපතල දඬුවම් ඉල්ලා සිටින වැරදි) හඳුනා නොගැනීම සාධාරණීකරණය කළ නොහැක.

71 (2012) 1 SLR 69.

72 HeleenTouquet, 'Sexual violence against men: enabling disclosure in the face of denial' (2018, Department of Gender Studies, London School of Economics and Political Science) available at https://blogs.lse.ac.uk/gender/2018/11/21/sexual-violence-against-men-enabling-disclosure-in-the-face-of-denial/; Charu Hogg, 'No Justice for Sri Lankan Male Survivors' (2017, Opinio Juris) available at http://opiniojuris.org/2017/06/26/no-justice-for-sri-lankan-male-survivors/.

## සමලිංගික සහකරුවන් අතර ලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා නොසැළකීම

ඉන්දියාවේ සහ නේපාලයේ සමලිංගික ලිංගික සම්බන්ධතා අපරාධ ගණයෙහි ලා නොසළන අතර, සමලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා සළකන නීතිය අවලංගු කිරීමේ පනතක් භූතානයේ පහළ මන්ත්‍රණ සභාවේදී සම්මත වී තිබේ.

ශ්‍රී ලංකාවේදී, ශ්‍රේෂ්ඨාධිකරණයට 365 අ වගන්තියේ තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා ලෙස ලෙස දඬුවම් නියම කිරීමට අදාළව මෑතකදී ඉදිරිපත් වූ අභියාචනයකදී අධිකරණය සඳහන් කළේ සමලිංගික හවුල්කරුවන් අතර ලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා සළකන නීති තවමත් අපේ නීතියේ කොටසක් බවයි. කෙසේ වෙතත්, *"එම ක්‍රියාව එකඟතාවයකින් යුතුව සිදු වූවකි"* යන කාරණය සැළකිල්ලට ගෙන අත්හිටවූ දඬුවමක් ලබා දෙන ලදී.[73]

*"මෙම වරද එංගලන්තයේ නීතියේ කොටසක් වූ මහජන සදාචාරය මත පදනම් වූ පුංමෛථුනය සහ ගුද මෛථුනය යන වැරදි සමග සම්බන්ධ වේ. ලිංගික අපරාධ පනත මගින් 2004 දී පුංමෛථුනය සහ ගුද මෛථුනය යන වැරදි අවලංගු කරන ලද අතර එය දැන් එංගලන්තයේ වරදක් නොවේ.*

*සමකාලීන චින්තනය, වැඩිහිටියන් අතර එකඟතාවයෙන්වන ලිංගිකත්වය සම්බන්ධයෙන් රජය විසින් නීති කටයුතු නොකිරීම මෙන්ම එය අපරාධකරණයට හේතු විය යුතු යැයි නොසිතිය යුතුය. එය වසර ගණනාවක් තිස්සේ වර්ධනය වී ඇති බවක් පෙනෙන්නට තිබේ. එංගලන්තයේ පුංමෛථුනය සහ ගුද මෛථුනය පිළිබඳ වරද අවලංගු කිරීමට හේතු වූ තර්කය මෙය විය හැකිය.*

*කෙසේවෙතත්, වරද යන්න අපගේ නීතියේ වැදගත් කොටසක් ලෙස ඉතිරිවී පවතී. අභියාචකයාට පෙර වැරදි හෝ අපරාධ ඉතිහාසයක් තිබී ඇති බව කීමට කිසිවක් නැත. එබැවින්, එම ක්‍රියාව තුළ එකඟතාවයක් ඇති බව සැළකිල්ලට ගෙන, අනෙක් චූදිතයන්ගේ පැත්තෙන් අපරාධ ඉතිහාසයක් නොමැති වීම නිසා සිර දඬුවමක් නියම කර වරදට පැමිණීම වරදට අනුකූල බවක් නොපෙනේ. මගේ මතය අනුව මෙය වැරදිකරුවන්ට තමන්වම නැවත සකස්කර ගැනීමට අවස්ථාවක් ලබා දිය යුතු සුදුසු අවස්ථාවකි".*

*විනිසුරු අලුවිහාරේ, පළාත්බද අධිකරණය, මරදාන පොලීසියේ ස්ථානාධිපති*
*එදිරිව ගලබඩ පයාගලගේ සනත් විමලසිරි, ශ්‍රේෂ්ඨාධිකරණයේ*
*අභියාචනා නඩු අංක 32/2011*

වැඩිහිටියන් අතර එකඟතාවයකින් යුතුව සිදුවන ලිංගිකත්වය අපරාධ ගණයෙහි ලා නොසැළකිය යුතුය යන සමකාලීන චින්තනය වසර ගණනාවක් තිස්සේ වර්ධනය වී ඇති බව අධිකරණය පිළිගනී. යමෙකුට මෙය අර්ථ නිරූපණය කළ හැක්කේ මෙම විෂයයේ ශ්‍රී ලාංකික නීතිය ව්‍යවස්ථාදායකය විසින් සමාලෝචනය කළ යුතු බවයි.

365 සහ 365 අ යන වගන්ති විවිධ ලිංගික දිශානතියන්ගෙන් පැමිණෙන පුද්ගලයින්ට වෙනස්කොට සළකන බැවින් මෙම විධිවිධාන අවලංගු කිරීමට අවශ්‍ය වේ. මෙම විධිවිධාන දෙක කිසිදු ලිංගික හිංසනයක් නොමැති ලිංගික ක්‍රියාකාරකම් වරදක් ලෙස හඳුනා ගනී. කෙසේවෙතත්, සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් තහනම් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රගතිශීලී පියවර ගනු ලැබූ

[73] *OICMaradana vs. GalabadaPayagalageSanathWimalasiri*, SC Appeal No 32/2011, 11-12 Available at http://www.supremecourt.lk/images/documents/sc_appeal_32_11.pdf.

ඉන්දියාවේ මෙන් නොව, ශ්‍රී ලංකාවේ එවැනි වෙනසකට ව්‍යවස්ථාදායකයේ ක්‍රියාත්මක වීම යන්න අවශ්‍ය වේ.

මෙම ප්‍රතිසංස්කරණයට විරුද්ධ විය හැකි අයගෙන් එල්ල විය හැකි තර්කයක් විය හැක්කේ "දරුවන් ආරක්ෂා කිරීම" යන අවශ්‍යතාවයයි. කෙසේවෙතත්, පවත්නා නීති රාමුව දරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයයි. 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත[74] මගින් ළමුන් සඳහා නෛතික ආරක්ෂාව තවදුරටත් වැඩි කරමින් ලිංගික අතවර කිරීම සම්බන්ධව නව වැරදි හඳුන්වා දෙනු ලැබීය.

## ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය

ලිංගික ක්‍රියාකාරකම් සඳහා කැමැත්ත පිළිබඳ වයසක් නියම කර තිබීම, වැඩිහිටි වියේ වැදගත් අංගයක්වන ලිංගිකත්වය පිළිබඳ තරුණ ප්‍රජාව සාකච්ඡා කිරීමට ඉගෙනීමේදී මහත් රුකුලක් වේ. මෙම සීමාව යම් තරුණ පුද්ගලයෙක් ලිංගිකත්වය සඳහා තවමත් "සූදානම්" නැත්නම් ඔහුට ලිංගික ක්‍රියාවල නිරත වීමට එන පීඩන වැළැක්වීමට ආරක්ෂාවක් සපයයි. වැඩිහිටියන් සතු පරිණතභාවය, මූල්‍ය ශක්තිය, ස්වාධීනත්වය සහ සමාන්‍යයෙන් වයසත් සමග එන තීරණ ගැනීමේ හැකියාව හේතුවෙන් වැඩිහිටි වියට පා තබන තරුණයින් හා වැඩිහිටියන් අතර බල ගතිකත්වයෙන් ප්‍රයෝජන ගන්නා වැඩිහිටියන්ගේ ලිංගික දියුණුවෙන් ආරක්ෂා වී ගවේෂණය කිරීමෙන් වැඩිහිටිභාවයට පත්වීමට නීතියෙන් ඔවුන්ට ඉඩ සලසයි.

දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන්නේ "පුරුෂයෙකු විසින්, ස්ත්‍රියක ඇය අවුරුදු 16 ට අඩුවන විට ඇගේ කැමැත්ත ඇතිව හෝ නොමැතිව ඇය සමග මෛථුනයේ යෙදේ නම් එය ස්ත්‍රී දූෂණයක් කළා සේ සැලකෙන්නේය"[75] යනුවෙනි. මානසික කැමැත්තක් පැවතීම යන තර්කනය සමග මෙම ප්‍රතිපාදනය කියවීමේ දී විස්තර වන්නේ 363 (ඉ) වගන්තිය යටතේ වරදකරුවෙකු වීමට අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකු ගේ කැමැත්ත යන්න අදාළ නොවන බවයි. ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය අවස්ථා දෙකකදී ඇති විය හැකිය යන අදහස අධිකරණය සහ නීතිය බලාත්මක කිරීම තුළ පැවත එන බව පෙනේ. එනම්:

1. අවුරුදු 16 ට අඩු ගැහැණු දරුවෙකුගේ කැමැත්ත ඇතිව හෝ
2. ඇගේ කැමැත්ත රහිතව

1995 දණ්ඩ නීති සංග්‍රහයට කළ සංශෝධනයන්ට අනුව වරද සිදුකළ තැනැත්තා අවුරුදු දහ අටකට අඩුවන තැනැත්තෙකු වන සහ සංසර්ගය සිදුකොට ඇත්තේ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිවවන අවස්ථාවක අනිවාර්ය අවම දඬුවම් කාලයට වඩා අඩු කාලයකට දඬුවමක් පැනවිය හැකිය. මෙම සංශෝධනය මගින් නඩු පවරන්නන් සමග ප්‍රේම සබඳතා පවත්වා එවැනි සබඳතා තුළ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සිදුකළ තරුණ පිරිමි ළමුන්ට සහනයක් සැළසීමට විනිසුරුවරුන්ට ඉඩ ලබා දී ඇතැයි යන්න අදහස් වේ.

> *"කෙසේවෙතත් වරද සිදු කොට ඇත්තේ අවුරුදු 16 ට කවඩා අඩු තැනැත්තෙකු සම්බන්ධයෙන්වන අවස්ථාවකදී, අධිකරණය විසින් වරද සිදුකළ තැනැත්තා අවුරුදු දහ අටකට අඩුවන තැනැත්තෙකු වන සහ සංසර්ගය සිදුකොට ඇත්තේ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව වන අවස්ථාවක, අවුරුදු දහයකට වඩා අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් ලබා දිය හැකිය"*

74 Available at https://www.oecd.org/site/adboecdanti-corruptioninitiative/46817262.pdf.

75 363 (ඉ) වැනි වගන්තිය.

සමහරවිට ශ්‍රී ලංකාවේ අපරාධ සම්බන්ධ දත්ත තුළ "කැමැත්ත සහිතව සිදුවන ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය" සම්බන්ධයෙන් යමෙක් ප්‍රතිවිරෝධී මත සහිත ගැටළුකාරී තත්ත්වයන් සොයා ගැනීමට හේතුව මෙම ප්‍රතිපාදනය විය හැකිය.[76] ශ්‍රී ලංකාවේ නීති කොමිසම විසින් ගැහැණු ළමයෙකුට කැමැත්ත ලබා දීමේ හැකියාවක් ඇති අවම වයස් සීමාවක් හඳුනා නොගැනීම ඇතුළත් කරුණු කිහිපයක් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේ.[77] ඇයට අවුරුදු 13 ක් නම් අධිකරණයට අභිමතය ක්‍රියාත්මක කළ හැකිද? අවුරුදු 11 කෙනෙකුට කැමැත්ත දිය හැකි ද? ඇයට අවුරුදු 9 1/2 ක් නම්, තත්ත්වය කුමක්ද?

මෙයට හාත්පසින්ම වෙනස් තත්ත්වයක් 365 (ආ) වගන්තිය යටතේ පිරිමියෙකුට එරෙහිව සිදු වන බරපතල ලිංගික අපයෝජන (පිරිමින් ස්ත්‍රී දූෂණයේ වින්දිතයන් ලෙස හඳුනාගැනීම් තුළ ඇති අර්ථ දැක්වීමේ සීමාව නිසා) යන අවස්ථාවක දැකිය හැකි අතර, එහිදී අවුරුදු 16 ට වඩා වයස අඩු පිරිමියෙකු "කැමැත්ත සහිතව" බරපතල ලිංගික අපයෝජනයකට ලක්කිරීමකට අදාළ දඬුවම් ලබා දීමට අධිකරණයට තම අභිමතය භාවිතා කිරීමට මෙවැනි විධිවිධාන මගින් ඉඩ ලබා නොදේ. මෙහිදී වින්දිතයාගේ ස්ත්‍රී පුරුෂභාවය මත අපරාධකරුට වෙනස් ලෙස සලකනු ලබයි. අවුරුදු 13 ක් වයසැති ගැහුණු ළමයෙකුව "ඇගේ කැමැත්ත සහිතව" යෝනිමය සංසර්ගයකට ලක්කොට දූෂණය කරන පුරුෂයෙකුට අත් හිටවූ සිරදඬුවම් ලබා දිය හැකි අතර, වයස අවුරුදු 13 ක පිරිමි දරුවෙකු " ඔහුගේ කැමැත්ත සහිතව" ගුදමය සංසර්ගයකට ලක්කොට දූෂණය කරනු ලබන පුරුෂයෙකුට එරෙහිව දඬුවම ක්‍රියාත්මක කිරීමේ දී ඔහුව අවුරුදු දහයකට නොඅඩු කාලයකට බන්ධනාගත කිරීම කරයි. මෙමගින් නීතිය යන්න පිරිමි ළමයාව දිගින් දිගටම ආරක්ෂා කරන අතර ගැහැණු ළමයා සඳහා ලිංගිකත්වය මත පිහිටා කටයුතු කර ඇති ආකාරය විදහා පෙන්වයි.

ඊටත් වඩා සැලකිලිමත් වීමට හේතු වන කරුණක් නම්, වාර්තා නොකළ නඩුවක අධිකරණ පූර්වාදර්ශය මත රඳා පවතින අධිකරණය විසින් වර්ධනය කරන ලද දඬුවම් ක්‍රියාවලියකි. මෙම භාවිතය සහ එහි ඇඟවුම් පහත දඬුවම් නියම කිරීම යටතේ සාකච්ඡා කෙරේ.

## දඬුවම් නියම කිරීම

2008 වසරේ දී අනුරාධපුර මහාධිකරණයේ මහාධිකරණ විනිසුරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණක් යොමු කරමින්, දණ්ඩ නීති සංග්‍රහයේ 1995 සංශෝධනය පනතේ 364 (2) (ඉ) වගන්තිය මගින් අවුරුදු 18 වඩා අඩු වයසැති ගැහැණු ළමයෙකුව දූෂණය කර චෝදනා ලබා සිටින අපරාධකරුවෙකුට දඬුවම් නියම කිරීමේදී අධිකරණ අභිමතය යන්න ඉවත් කර ඇතිදැයි විමසා සිටින ලදී. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒකමතික මතය වූයේ "362 (2) (ඉ) යන වගන්තිය තුළ දක්වන අනිවාර්යය අවම දඬුවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ), 11 සහ 12 (1) යන ප්‍රතිපාදන සමග ඝට්ටනයක් ඇති කරයි. එබැවින් අවම අනිවාර්ය දඬුවමක් පැවතුන ද මහාධිකරණයට යෝග්‍යයැයි හැඟෙන පරිදි අධිකරණ අභිමතය ක්‍රියාත්මක කරමින් දඬුවමක් පැනවීමට වැළැක්වී නැත".[78]

මෙම නඩුවේ ප්‍රතිඵලයක් ලෙස විනිසුරුවරුන් තව දුරටත් අවුරුදු 18 ට වඩා අඩු ස්ත්‍රියක දූෂණය කළ විට ලබාදෙන අනිවාර්ය අවම දඬුවම පැනවීමට බැඳී සිටින්නේ නැත. වරද සිදු කළ

---

[76] බලන්න Grave Crimes Abstract (2019) at https://www.police.lk/images/crime_ststistics/2019/Grave-crime-abstract-for-the-Year-2019.pdf

[77] Explanatory Note on the Sentencing Policy with Regard to Statutory Rape and Matters Connected Thereto (Sri Lanka Law Commission) Available at https://lawcom.gov.lk/web/images/stories/reports/explanatory_note_on_the_sentencing_policy.pdf.

[78] SC Reference 3/2008, HC Anuradhapura Case No. 333/2004, SCM 15.10. 2008 - 2008 B.L.R. - Part III - BASL Law Journal (2008) Vol XIV - 160
*Rohana alias Loku vs. AG* [2011] 2 SRI L.R 174 available at https://www.lawnet.gov.lk/wp-content/uploads/2017/01/Law-Report-part-7.pdf page 178

තැනැත්තාගේ වයස අවුරුදු 18 වන විට පමණක් අදාල වන 364 (2) වගන්තියේ එන ප්‍රතිපාදන මෙන් නොව මෙම නීතිය වැරදිකරුගේ වයස නොසළකා අදාල වේ.

මෙම නඩු තීන්දුවෙන් ස්ථාපිත කරන ලද පූර්වාදර්ශය අධිකරණය තුල ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සිදු කරන ලද වැරදිකරුවන්ට අත්හිට වූ සිර දඬුවම් නියම කිරීමේ අධිකරණ ක්‍රියාපාටිපායක් ඇති කිරීම දක්වා නැගී එන ලදී. ***මාරම්බ ලියනගේ රෝහණ එදිරිව නීතිපති***[79] යන නඩුවේ දී නඩු පැවරූ තැනැත්තිය සහ චෝදනා ලද තැනැත්තා අතර සබඳතාවයක් පැවති අතර නඩු පවරන ලද තැනැත්තිය විසින් චෝදනා ලද තැනැත්තාට තමාව නිවසින් පිටතට රැගෙන යන ලෙස ඉල්ලීමක් කර තිබුණි. අධිකරණය විසින් ඉහත නඩු තීන්දුව අනුගමනය කරමින් අත් හිටවූ සිර දඬුවම් ලබා දෙන ලදී. *"චෝදනා ලද තැනැත්තා දණ්ඩ නීති සංග්‍රහයේ 364 (2) (ඉ) වගන්තියෙහි දක්වා ඇති වරදට තාක්ෂණික ලෙස සළකා බැලූ කල වැරදිකරු වේ. කෙසේවෙතත් නඩුවේ සිද්ධිමය කරුණු සහ නීතිඥවරුන් විසින් ගොනුකර ඇති ලිඛිත කරුණු සලකා බැලීමේ දී මෙය චූදිතයා රැදවුම් භාරයේ තබන දඬුවමකින් ඔහුට පීඩා විදීමට සිදුවන නඩුවක් නොවේ"*[80]

කෙසේවුවත් සාමාන්‍යයෙන් අනුරාධපුර මහාධිකරණ නඩු තීන්දුව (යොමුව 3/2008) මත විශ්වාසය තබමින් විනිසුරුවරුන්ට වර්තමානයේ අධිකරණ අභිමතය භාවිතා කල හැකියි යන්න පිළිගැණුනි. කැමැත්ත නොමැති අවස්ථාවක් සම්බන්ධ නඩුවලදී විනිසුරුවරයෙකුට අධිකරණ අභිමතය භාවිතා කිරීමෙන් මේ සඳහා ඇති අවම දණ්ඩනය නොසළකා හැරීමට කිසිදු බාධාවක් නොමැත.

තවද *නීතිපති එදිරිව සමන්ත සම්පත්* [81] යන නඩුවේදී ද අනුරාධපුර මහාධිකරණ නඩු තීන්දුව අනුගමනය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අත්හිටවූ සිරදඬුවම් නියම කරන ලදී. මෙම නඩුවේ නඩු පවරන ලද තැනැත්තිය විසින් ලිංගික සංසර්ගය සඳහා කැමැත්ත ලබා දුන් බවට සාක්ෂියක් නොතිබුණි. එම දෙදෙනා අතර ප්‍රේම සම්බන්ධතාවයක් පැවති බවට ද සාක්ෂියක් නොතිබුණි. චෝදනා ලද තැනැත්තා නඩු පවරන ලද තැනැත්තියගේ මස්සිනාය. ඒ වනවිට ඇයට වයස අවුරුදු 15 කි.
බන්ධනාගාර භාරයේ තැබීම අවශ්‍ය නැති බව තහවුරු කරමින් අධිකරණය මෙහිදී දෙමාපියන් විසින් පොලිස් පැමිණිල්ලක් නොකළ බව සාකච්ඡා කළේය. එහිදී සඳහන් කරන ලද්දේ "වින්දිත ගැහැණු ළමයා විසින් ඒ වේලාවේ පොලිසියට කිසිදු පැමිණිල්ලක් නොකළ බවයි". ස්ත්‍රී දූෂණය සිදු වන අවස්ථාවේදී නඩු පවරන ලද තැනැත්තියද ළමයෙකු වූ අතර අධිකරණය විසින් ඇගේ අයිතීන්ට එරෙහිව ස්ත්‍රී දූෂණය හේතුවෙන් ඇයට උපන් දරුවාගේ අයිතීන් වෙනුවෙන් වැඩි බරක් තැබීම සිදු කල බව පෙනේ. *"මෙම නඩුවේ දී ස්ත්‍රී දූෂණයේ වින්දිතයා, අභියාචකයා, උපත ලද දරුවාගේ පියා, සහ වින්දිතයාව දූෂණය කිරීම හේතුවෙන් මේ ලෝකයට බිහිවූ අවුරුදු 10 ක් වයසැති ගැහැණු දරුවා දෙස අප පුළුල් චිත්‍රයකින් බැලිය යුතුය"* [82]

අධිකරණය විසින් අවම අනිවාර්ය දණ්ඩනය නොසළකා හරිමින් මෙවැනි නඩුවල අධිකරණ අභිමතය භාවිතා කිරීම 1979 අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 303 වැනි වගන්තිය මගින් ස්ථාපිත කරන ප්‍රතිපාදනය, එනම් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමේ අධිකණ නියමයක් අධිකරණය විසින් අත්හිටවූ දණ්ඩන නියමයක් බවට පත් කිරීම සමග ප්‍රතිවිරෝධී වේ.
303 වගන්තිය පහත පරිදි වේ:

---

79 *Rohana alias Loku vs. AG* [2011] 2 SRI L.R. 174.

80 180 පිටුව බලන්න

81 AG vs. Samantha Sampath (2015) S.C. Appeal No. 17/2013 http://www.supremecourt.lk/images/documents/sc_appeal_17_13.pdf.

82 එහිම

303 (1) වරදක් සඳහා වරදකරුවකුට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කළ අධිකරණයක් විසින්, ආඥාවෙහි දින සිට අවුරුදු පහකට නොඅඩු වූ ද ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද (මෙහි මින් මතු "ක්‍රියාත්මක වන කාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලයක් තුළ දී ඒ වරදකරු විසින් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි (මෙහි මින් මතු "තදන්තර වරද" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් වරදක් කරනු ලැබුවහොත් මිස, එම දණ්ඩන නියමය ක්‍රියාත්මක නොකළ යුතු යයි ආඥා කළ හැකිය.

මෙහිදී සැළකිල්ලට ගත යුතු කාරණය නම් දණ්ඩ නීති සංග්‍රහයේ 364 (2) (ඉ) වගන්තිය වයස අවුරුදු 18 ට වඩා අඩු ස්ත්‍රියක් දූෂණ කිරීමේ වරද සම්බන්ධ ප්‍රතිපාදනය මගින් අනිවාර්ය බන්ධනාගාරගත කිරීමේ දඬුවම පැනවීම තහවුරු කර ඇති බවයි. ව්‍යවස්ථාවේ භාෂාව පැහැදිලිවන අතර එය ව්‍යවස්ථායකයේ අරමුණ පිළිබඳ සාක්ෂියකි.

1995 සංශෝධනය හරහා අවුරුදු 10 ක අනිවාර්ය දණ්ඩණයක් ගෙන ඒම තුළින් ව්‍යවස්ථාදායකය විසින් මෙවැනි අවස්ථාවල අත්හිටවූ සිරදඬුවමක් ලබා දීමට අවසර දීම අරමුණු නොකළ බව පැහැදිලිය. ඒ නිසා ලිඛිත නීතිය නොතකා අධිකරණයේ අභිමතය භාවිතය (නීතිය විසින් සපායා නොමැති) නීතියට පටහැනි බවට තර්ක කල හැක. අනුරාධපුර මහාධිකරණ නඩුව විමසන ලද ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල වැනි ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ මෙම අධිකරණ භාවිතය අභියෝගයට ලක් කරමින් යෝග්‍ය තීන්දුවක් දීමට විමසුමක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඇත. විනිසුරුවරුන් තුන් දෙනෙකුට වඩා වැඩි විනිසුරු මඬුල්ලකට තවදුරටත් තීන්දුවේ නිරවද්‍යතාවය පිළිබඳව තීන්දුවක් ලබා දිය හැකිය.

## සාක්ෂි පිළිබඳ නීති

ශ්‍රී ලංකාවේ, ස්ත්‍රියගේ චරිතය දෝෂාභියෝගයට ලක් කිරීම සඳහා වින්දිතයාගේ ලිංගික ඉතිහාසය අධිකරණයට ඉදිරිපත් කළ හැකිය. ස්ත්‍රියකගේ 'දුරාචාර චරිතය' නඩුවක ප්‍රතිඵලයට බලපෑම් කළ හැකිය යන මතය මූලික වශයෙන් ලිංගික හිංසනය සම්බන්ධ නීතියේ කේන්ද්‍රයේ තිබිය යුතු කැමැත්ත පිළිබඳ සංකල්පය හෑල්ලුවට ලක් කරයි.

සාක්ෂි ආඥා පනතේ[83] 155 වැනි වගන්තිය මගින් සාක්ෂිකරුවෙකුගේ චරිතය දෝෂාභියෝගයට ලක්කළ හැක්කේ කෙසේද යන්නට විධිවිධාන දක්වන අතර එහිදී සාක්ෂිකරුවෙකුගේ චරිතය විරුද්ධ පාර්ශ්වය මගින් හෝ අධිකරණයේ කැමැත්ත ඇතිව එවැනි සාක්ෂිකරුවෙකුව කැඳවන පාර්ශ්වයක් විසින් සාක්ෂිකරුවෙකුගේ චරිතය දෝෂාභියෝගයට ලක්කළ හැකිය. ඇ උපවගන්තියේ සඳහන් වන්නේ,"*ස්ත්‍රී දූෂණය කිරීමක් ගැන හෝ දූෂණය කිරීමට තැත් කිරීමක් ගැන මිනිසෙකුට විරුද්ධව නඩු පවරනු ලැබූ විට, චෝදක තැනැත්තී සාමාන්‍යයෙන් අයහපත් චරිතයකින් යුක්ත යැයි පෙන්විය හැකිය*" යනුවෙනි. මෙම විධිවිධානය ස්ත්‍රීන් "යහපත් ස්ත්‍රීන්" වීම සඳහා ඔවුන්ගේ ලිංගිකත්වය යටපත් කළ යුතුය යන්න ඉල්ලා සිටින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් ප්‍රතිස්ථාපිත කිරීමකි. මෙය පීතෘමූලික සාරධර්ම නීති පද්ධතියට ඇතුළු වී ඇති ආකාරය පිළිබඳ නිදසුනකි.

ඉන්දියාවේ, වින්දිතයෙකුගේ ලිංගික ඉතිහාසය පිළිබඳ සාක්ෂි යන්න නීතිය පැහැදිලිවම තහනම් කරයි. 2013 අංක 13 දරන පනත මගින් සංශෝධිත සාක්ෂි පනතේ 53 (A) වැනි වගන්තියෙහි දක්වන්නේ "*කැමැත්ත පිළිබඳ ප්‍රශ්නය ගැටලුවක්වන තැනදී, වින්දිතයාගේ චරිතය හෝ එවැනි පුද්ගලයෙකු ඕනෑම පුද්ගලයෙකු සමග පැවැති පෙර ලිංගික අත්දැකීම් පිළිබඳ සාක්ෂි එවැනි කැමැත්ත හෝ කැමැත්තේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටලුවකට අදාළ නොවේ*".

[83] Available at http://hrlibrary.umn.edu/research/srilanka/statutes/Evidence_Ordinance.pdf.

"ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණය සහ සාක්ෂි ක්‍රියාවලිය" (Rape and the Evidentiary Process in Sri Lanka) යන පත්‍රිකාව යටතේ ප්‍රියා තංගරාජා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණ සිද්ධීන් සම්බන්ධයෙන් සාක්ෂි එකතු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධ ගැටළුසහගත ක්‍රියාමාර්ග විස්තරාත්මකව සාකච්ඡා කළේය. සාක්ෂි එකතු කිරීම සම්බන්ධයෙන් ඇති ගැටළුසහගත භාවිතයන්ගෙන් එකක් වන්නේ ස්ත්‍රියකගේ ලිංගික ඉතිහාසය තක්සේරු කිරීම සඳහා කන්‍යා පටලය සහ යෝනි ප්‍රත්‍යාස්ථතාව / නම්‍යතාව පරීක්ෂා කිරීමයි.

ශ්‍රී ලංකාවේ මෙම ක්‍රියාමාර්ගය භාවිතයට ගැනීම සම්බන්ධයෙන් 2010 දී ආචාර්ය S.R Hulathduwa විසින් ලියන ලද ලිපියක සඳහන් වේ. *"2003 දී එක්සත් රාජධානියේ පළපුරුදු අධිකරණ වෛද්‍යවරුන් විසින් සකස් කරන ලදැයි කියන කන්‍යා පටලයේ විශ්කම්භය ප්‍රවේශ වීම සඳහා පරීක්ෂකගේ ඇඟිලි ස්ත්‍රියකගේ යෝනි මාර්ගයට ඇතුළු කිරීම යන්න, ස්ත්‍රී දූෂණ චෝදනාවලදී කාන්තා ලිංගේන්ද්‍රිය පරීක්ෂා කිරීම / නියැදීම පිළිබඳ දැනට පිළිගත් ක්‍රමවේදයට ඇතුළත් නොවේ. ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක හා නීතිමය කටයුතුවල නියැලී සිටින වෛද්‍යවරුන් සැළකිය යුතු සංඛ්‍යාවක් අතර තවමත් එය භාවිතයේ පැවතුනද, මෙම පෙර නොවූ හා අපහසුතාවයට පත්වන ක්‍රියාව දැඩි ලෙස අධෛර්යමත් කළ යුතුය. ඇඟිලි ඇතුළු කිරීමෙන් දිගු කළ හැකි ශරීර කොටසක් මැනීමට ගන්නා ඕනෑම උත්සාහයක් විද්‍යාත්මක නොවන බව සාමාන්‍ය දැනීමකි."* [84]

*"සාමාන්‍යයෙන් පිළිගෙන ඇත්තේ කන්‍යා පටල ප්‍රත්‍යාස්ථතාව නිසා සමහර වැඩිවියට පැමිණි ස්ත්‍රීන්ට කන්‍යා පටලයට හානියක් නොවී ශිෂ්ණය යෝනිය තුළට ප්‍රවේශනය කළ හැකි බවයි. මෙය කන්‍යා පටලය නොවෙනස්ව පැවැත්වීම මිථ්‍යා සංකල්පය අහෝසි කරයි. නැවතත්, අපි මෙය පහසුවෙන් පිළිගන්නවාද?"*, යනුවෙන් ඔහු තවදුරටත් ලියයි.

අධිකරණ වෛද්‍ය සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රියාවලිය ගෙනහැර දක්වමින් තංගරාජා පෙන්වා දුන්නේ, "ඇඟිලි දෙකේ පරීක්ෂණය" මගින් ලිංගික හිංසනය ප්‍රධාන වශයෙන් සංසර්ගය ලෙස වටහා ගැනීම නිරූපණය කරන අතර, ලිංගික හිංසන සිදුවීම් තුළ ස්ත්‍රී ශරීරයේ හෝ මනසේ තත්ත්වය පූර්ණ ලෙස අවබෝධ කර ගැනීමට ඇති අකමැත්ත අවධාරණය කරන බවයි. මෙම භාවිතය *"හිංසනය අඛණ්ඩව පැවතීමේ අනිවාර්ය අංගයක් වුවද, මෙම ක්‍රියාව කිසි විටෙකත් එවැනි දෙයක් ලෙස නොසළකයි".*[85]
ප්‍රායෝගිකව, මෙම පරීක්ෂණය සැබවින්ම අදාළ වන්නේ කෙසේද? වින්දිතයෙකු වෛද්‍ය පරීක්ෂණයකට භාජනයවන විට, අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු හෝ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් වෙනත් කරුණු අතර නිරීක්ෂණය කරන ලද තුවාල, කන්‍යා පටලයේ ස්වභාවය, කන්‍යා පටල ප්‍රත්‍යාස්ථතාව සහ 'නැවත නැවත ශිෂ්ණය ප්‍රවේශනය වීම' සිදුවී ඇත්දැයි පරීක්ෂා කර වාර්තා කරනු ඇත. වෛද්‍ය නිලධාරියා 'නැවත නැවත ශිෂ්ණය ප්‍රවේශනය වීම' යන්න පරීක්ෂා කළත්, වින්දිතයාගේ ප්‍රකාශයේ දී ඇය පවසන්නේ ඇය කිසි විටෙක පුරුෂයෙකු සමග කිසිදා ලිංගික සංසර්ගයෙහි යෙදී නොමැති බවයි. සාක්ෂිකරුවෙකු ලෙස ඇයගේ එම ප්‍රකාශය සාක්ෂි ආඥා පනතේ 155 වගන්තිය යටතේ දෝෂාභියෝගයට ලක්කළ හැකිය. 'යෝනි ප්‍රත්‍යාස්ථතාව' (vaginal elasticity) වෛද්‍යවරයාට 'නැවත නැවත ශිෂ්ණය ප්‍රවේශනය වීම' සිදුවී ඇත්දැයි යන්න දැනුම් දෙයි. ගැටළුව වන්නේ ලිංගික සංසර්ගය හේතුවෙන් යෝනි ප්‍රත්‍යාස්ථතාව වැඩි වන බවට විද්‍යාත්මක සාක්ෂි නොමැති වීමයි.

---

84 S.R. Hulathduwa, 'Some Common Pit-falls in the Practice of Forensic Medicine in Sri Lanka.A Review of International Literature', Sri Lanka Journal of Forensic Medicine, Science & Law 2010 Vol.1 No.1 pp.15-21. Available at https://sljfmsl.sljol.info/articles/abstract/10.4038/sljfmsl.v1i1.2711/

85 Priya Thangarajah, "Rape and the Evidentiary Process in Sri Lanka', The Search for Justice: The Sri Lanka Papers, Kumari Jayawardena & Kishali Pinto-Jayawardena (Editors), Zubaan, 2016.

2014 දී ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් සම්පාදනය කරන ලද වෛද්‍ය-නෛතික අරමුණු සඳහා ලිංගික අතවරයට ලක්වූවන් පරීක්ෂා කිරීම, වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ ජාතික මාර්ගෝපදේශනය, කෙසේ වෙතත්, ඇඟිලි දෙකක පරීක්ෂණයක් නිර්දේශ නොකරයි.[86] අවශ්‍ය නම් ලිංගික ප්‍රදේශය පරීක්ෂා කිරීම සඳහා වීදුරු කූරක් හෝ කැඩපතක් භාවිතා කළ හැකිය. කෙසේ වෙතත්, මාර්ගෝපදේශනය මෑතකාලීනව, පූර්වයෙන් හෝ නැවත නැවත ප්‍රවේශනය වීමේ සාක්ෂි පිළිබඳව අදහස් විමසීමට ආරාධනා කරයි.[87]

මෙම ක්‍රියා පටිපාටිය බංග්ලාදේශයේ තහනම් කර ඇත.[88] එය ඉන්දියාවේ ද තහනම්ය. 2013 දී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන්නේ "ඇඟිලි දෙකේ පරීක්ෂණය සහ එහි අර්ථ නිරූපණය ස්ත්‍රී දූෂණයෙන් දිවි ගලවා ගත් අයට පෞද්ගලිකත්වය, ශාරීරික හා මානසික අඛණ්ඩතාව සහ ගෞරවය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කරන" බවයි.[89]

86 The College of Forensic Pathologists of Sri Lanka, National Guidelines on Examination, Reporting and management of Sexually Abused Survivors for Medico-Legal Purposes, 2014. Available at http://medical.sjp.ac.lk/downloads/forensic-medicine/Medico%20Legal%20Purposes.pdf

87 16 වැනි පිටුව බලන්න

88 ප්‍රවෘත්ති වාර්තාව බලන්න at https://www.thedailystar.net/frontpage/hc-bans-2-finger-taste-1562242.

89 Rajesh & Anr vs. State of Haryana (2013) Available at https://indiankanoon.org/doc/78844212/

# නිර්දේශ

ඉහත සාකච්ඡාවට අනුව, ස්ත්‍රී දූෂණය හා සම්බන්ධයෙන් නීති සඳහා වෙනස්කම් හතරක් නිර්දේශ කළ හැකිය.

1 ස්ත්‍රී දූෂණ වරද ප්‍රති-අර්ථකථනය කිරීම

කැමැත්ත පිළිබඳ සංකල්පය කේන්ද්‍ර කරගනිමින් ස්ත්‍රී දූෂණය යන්න ප්‍රති-අර්ථකථනය කිරීමට අවශ්‍ය වේ. දණ්ඩ නීති සංග්‍රහයෙහි 363 ආ) සිට (ඉ) දක්වා ඇති 'කැමැත්ත ඇති විට...' යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කිරීම, එවැනි කැමැත්තක් නොමැති අවස්ථාවලදී පවා කැමැත්ත ප්‍රකාශ කිරීම හුදෙක් එකඟතාවයක් ඇති බවට වන වැරදි වැටහීමකට ඉඩ දෙයි.

කැමැත්ත පිළිබඳ සංකල්පය කේන්ද්‍ර කරගනිමින් ස්ත්‍රී දූෂණය පිළිබඳව වගන්තිය ප්‍රති-ප්‍රකාශ කළ හැක්කේ කෙසේද යන්න පහත උදාහරණයෙන් දැක්වේ:

**ස්ත්‍රී දූෂණය**

1. පුරුෂයෙකු කිසියම් ස්ත්‍රියකගේ කැමැත්තෙන් තොරව ලිංගික ස්වභාවයකින් ප්‍රවේශනයක් සිදු කරනවානම් ඔහු ස්ත්‍රී දූෂණය වරද සිදු කරයි.

2. කැමැත්තකින් තොරව සිදු කරන විට පහත සඳහන් ක්‍රියා ස්ත්‍රී දූෂණය නම් වේ:
   - ස්ත්‍රියකගේ යෝනියට, ගුදයට, හෝ මුඛයට පුරුෂ ලිංගය ඇතුළු කිරීම.
   - පුරුෂ ලිංගය අරෙන්නට මිනිස් ශරීරයේ ඕනෑම කොටසක් හෝ ඕනෑම වස්තුවක් ස්ත්‍රියකගේ යෝනියට, ගුදයට, හෝ මුඛයට ඇතුළු කිරීම.

**පළමු පැහැදිලි කිරීම**

කැමැත්ත යනු ලිංගික සංසර්ගයක නිරතවීම සඳහාවන පැහැදිලි සහ සක්‍රීය සන්නිවේදනය වේ.

කැමැත්ත ස්වේච්ඡාවෙන් දෙන ලද දෙයක් මිස එය බලෙන් හෝ බලහත්කාරයෙන් ලබාගත නොහැකිය.

කැමැත්ත යන්න ඇය හෝ කිසියම් පුද්ගලයෙකු මරණය බය ඇති කිරීම, දූෂණය, බරපතල ලිංගික අපයෝජනය, දරුණු හිංසනය හෝ හිංසනය මගින් ලබාගත නොහැකිය.

සිහිවිකලත්වය සහිත ස්ත්‍රියක්, අවිඥානය සහිත ස්ත්‍රියක්, හෝ මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය බලපෑම යටතේ සිටින ස්ත්‍රියක් ලිංගික සංසර්ගය සඳහා කැමැත්ත දීමට අපොහොසත්ය.

ස්ත්‍රියකගේ ස්වාමි පුරුෂයා හෝ අවිවාහක සහකරු ලෙස ව්‍යාජ ලෙස හැසිරෙන පුරුෂයෙකුට, පුරුෂයෙකු ඇයගේ ස්වාමි පුරුෂයා හෝ අවිවාහක සහකරු වේ යැයි විශ්වාස කරන ස්ත්‍රියක් පුරුෂයෙකුට කැමැත්ත දිය නොහැක.

වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුට කැමැත්ත ලබාදිය නොහැක.

පොලිස් සිරභාරයේ හෝ බන්ධනාගාරගතව සිටින ස්ත්‍රියකට කැමැත්ත ලබාදිය නොහැක.

ලිංගික ක්‍රියාකාරකමක ඕනෑම වේලාවකදී කැමැත්ත අහෝසි කළ හැකිය.

**දෙවැනි පැහැදිලි කිරීම**

හුදු ශාරීරික විරෝධතාවය නොමැතිවීම යන්න කැමැත්ත යනුවෙන් අදහස් නොවේ.

**තෙවැනි පැහැදිලි කිරීම**

යෝනි මුඛයේ බාහිර තොල් ප්‍රවේශනය වීම යන්න පුරුෂ ලිංගය, පුරුෂ ලිංගය ඇරෙන්නට මිනිස් ශරීරයේ ඕනෑම කොටසක්, හෝ ඕනෑම වස්තුවක් යෝනියට ඇතුළු කිරීමේ ක්‍රියාව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත්ය.

එසේම මෙම අර්ථකථනය ප්‍රබල ලෙස වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධකරණයට ලක් කරන බව සැළකිය යුතුය. එය ශිෂ්ණය ගුදය සහ මුඛය වෙත ප්‍රවේශනය කිරීමේ සහ වස්තුවක් හෝ පුරුෂ ලිංගය ඇරෙන්නට මිනිස් ශරීරයේ කිසියම් කොටසක් ගුදය සහ මුඛය වෙත ප්‍රවේශනය කිරීම ඇතුළත් කිරීම ද දක්වා වරදෙහි විෂය ප්‍රමාණය පුළුල් කරයි.

එසේම මෙම අර්ථකථනය, ඇය විසින්ම ගත් මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය නිසා මත් වුණු ස්ත්‍රියකට අදාළ දූෂණය ද අපරාධයක් සේ සළකයි. ස්ත්‍රියක් ඇය මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර භාවිතය නිසාවෙන් නීතියේ ආරක්ෂාවෙන් බැහැර කිරීම පුරුෂ මූලික ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රතිමාන මත පදනම් වූ යුක්තිසහගත නොවන නොසළකා හැරීමකි.

වරදේ දණ්ඩනීය වගන්තිය සතුව දණ්ඩන නියම සඳහා පැහැදිලි උපදෙස් තිබිය යුතුය. අනිවාර්ය අවම දඬුවමක් ඇති වැරදි සඳහා අත්හිටවූ සිරදඬුවම් පැනවීමේ ගැටලුව නීතිය විසින් ආමන්ත්‍රණය කළ යුතුය. නීතිය ප්‍රගතිශීලී ලෙස විකාශනය වීමට අධිකරණ අභිමතිය අවශ්‍යවන විට ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රතිමාන සහ ඒකාකෘති අධිකරණ පද්ධතියට කාන්දුවන විට අධිකරණ අභිමතිය ස්ත්‍රීන්ට අසාධාරණ ප්‍රතිඵල ගෙන ඒමට මග පෙන්විය හැකිය. ඒ අතරම, නීතිය පැහැදිලි, පුරෝකතනය කළ හැකි සහ අත්තනෝමතික නොවිය යුතුය.

අධිකරණය අසාධාරණ දඬුවම් සඳහා විධිවිධාන සොයාගනී නම් නීති සම්පාදනය සඳහා ප්‍රතිසංස්කරණ ඇති කළ යුතුය. මේ ආකාරයට නීතිය පැහැදිලි සහ සෑම කෙනාටම සමාන බව තහවුරු කළ හැකිය. අධිකරණය විසින් අභිමතිය භාවිතා කරන විට, එක් අයෙකු විසින් උදාහරණ වශයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ඒකාකෘති මත පදනම් වූ ප්‍රාග්නිශ්චය, පක්ෂපාතීත්ව, ක්‍රියාවලි තුළ ඇති දුර්මතවල පැවැත්ම ඉවත් කරන්නේ කෙසේද?

## 2. 365 සහ 365 ආ වගන්ති අවලංගු කිරීම

මෙම වගන්ති දෙකම කැමැත්ත සහිතව වැඩිහිටියන් අතර ස්වේච්ඡාවෙන් සිදුවන ලිංගික ක්‍රියාව අපරාධ ගණයෙහි ලා සළකයි. මෙම නීති සමලිංගිකතාව අපරාධ ගණයෙහි ලා සැළකීමට අවශ්‍ය වූ 19 වැනි සියවසේ වික්ටෝරියානු සදාචාරයේ අවශේෂ වේ. සමලිංගිකතාව යන්න අස්වාභාවික ආබාධයක් නොවන බව විද්‍යාව විසින් පෙන්වා දීමට පටන්ගත් දා සිට සමලිංගික ලිංගික ක්‍රියා අපරාධ ගණයෙහි ලා සැළකීම යුක්ති සහගත නොවේ. ඇමරිකානු මනෝචිකිත්සක සංගමය මගින් සමලිංගිකතාව යන්න නිර්-ව්‍යාධිකරණය කරනු ලැබුවේ වසර 50 කට පමණ පෙරය.[90]

365 ආ වගන්තිය කැමැත්ත සහිත වැඩිහිටියන් අතර ස්වේච්ඡාවෙන් සිදුවන ලිංගික ක්‍රියාවට අමතරව ප්‍රසිද්ධියේ පුංමෛථුන ක්‍රියාවේ යෙදීමද අපරාධ ගණයෙහි ලා සළකයි. එමනිසා, ලිංගික ක්‍රියාවන් ප්‍රදර්ශනයෙන් මහජනතාව ආරක්ෂා කරගැනීම පිණිස 365 ආ වගන්තිය තබාගත යුතු යැයි කෙනෙක්ට තර්ක කළ හැකිය. නමුත් 1841 අංක 04 දරණ අයාල ආඥා පනතේ 7 (1) (b) ප්‍රසිද්ධියේ පුංමෛථුන ක්‍රියාවේ යෙදීම දැනටමත් අපරාධ ගණයෙහි ලා සළකා ඇත.

## 3. බරපතල ලිංගික අපයෝජන වරද ප්‍රති-අර්ථකථනය කිරීම

ස්ත්‍රී දූෂණ වරද ප්‍රති-අර්ථකථනය කිරීම යටතේ ඉහත උදාහරණයට සමානවම මෙම වරදද කැමැත්ත කේන්ද්‍රකොට ගනිමින් වර්ධනය කළ යුතුය.

මෙම වගන්තිය ප්‍රති-ප්‍රකාශ කළ හැක්කේ කෙසේද යන්න පහත උදාහරණයෙන් දැක්වේ:

90 The New York Times '*Psychiatrists, in a Shift, Declare Homosexuality No Mental Illness', 16/12/1973. Archived at https://www.nytimes.com/1973/12/16/archives/psychiatrists-in-a-shift-declare-homosexuality-no-mental-illness.html*

**බරපතල ලිංගික අපයෝජන**

1. යම් පුද්ගලයෙක් ලිංගික තෘප්තිය ලබාගැනීම සඳහා අනෙක් පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව ලිංගේන්ද්‍රය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් පාවිච්චි කිරීමෙන්, 363 වගන්තිය යටතේ ඇති ස්ත්‍රී දූෂණයට අයත් නැති ක්‍රියාවක් වන්නේ නම් එවැනි පුද්ගලයෙකු බරපතල ලිංගික අපයෝජනයක් සිදු කරයි.

**පළමු පැහැදිලි කිරීම**

කැමැත්ත යනු ලිංගික සංසර්ගයක නිරතවීම සඳහාවන පැහැදිලි සහ සක්‍රීය සන්නිවේදනය වේ.

කැමැත්ත ස්වේච්ඡාවෙන් දෙන ලද දෙයක් මිස එය බලෙන් හෝ බලහත්කාරයෙන් ලබාගත නොහැකිය.

'කැමැත්ත' යන්න ඇය හෝ කිසියම් පුද්ගලයෙකුට මරණ බය ඇති කිරීම, දූෂණය, බරපතල ලිංගික අපයෝජනය, දරුණු හිංසනය හෝ හිංසනය මගින් ලබාගත නොහැකිය.

සිහිවිකලත්වය සහිත ස්ත්‍රියක්, අවිඥානය සහිත ස්ත්‍රියක්, හෝ මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය බලපෑම යටතේ සිටින ස්ත්‍රියක්ට ලිංගික සංසර්ගය සඳහා කැමැත්ත දීමට අපොහොසත්ය.

ස්ත්‍රියකගේ ස්වාමි පුරුෂයා හෝ අවිවාහක සහකරු ලෙස ව්‍යාජ ලෙස හැසිරෙන පුරුෂයෙකුට පුරුෂයෙකු ඇයගේ ස්වාමි පුරුෂයා හෝ අවිවාහක සහකරු වේ යැයි විශ්වාස කරන ස්ත්‍රියක් පුරුෂයෙකුට කැමැත්ත දිය නොහැක.

වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකුට කැමැත්ත ලබාදිය නොහැක.

පොලිස් සිරභාරයේ හෝ බන්ධනාගාරගතව සිටින ස්ත්‍රියකට කැමැත්ත ලබාදිය නොහැක.

ලිංගික ක්‍රියාකාරකමක ඕනෑම වේලාවකදී කැමැත්ත අහෝසි කළ හැකිය.

**දෙවැනි පැහැදිලි කිරීම**

හුදු ශාරීරික විරෝධතාවය නොමැතිවීම යන්න කැමැත්ත යනුවෙන් අදහස් නොවේ.

**තෙවැනි පැහැදිලි කිරීම**

යෝනි මුඛයේ බාහිර තොල් ප්‍රවේශනය වීම යන්න පුරුෂ ලිංගය, පුරුෂ ලිංගය ඇරෙන්නට මිනිස් ශරීරයේ ඕනෑම කොටසක්, හෝ ඕනෑම වස්තුවක් යෝනියට ඇතුළු කිරීමේ ක්‍රියාව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත්ය.

ඒ අතරම, බරපතල ලිංගික අපයෝජන යන වරද ස්ත්‍රී දූෂණ වරදට අනන්‍ය කරුණුවලට සමාන නිසා බරපතල ගණයෙහි ලා සැළකෙන වරදක් බවට පත් කළ යුතුය. උදාහරණ ලෙස බලධාරියෙකු විසින් සිදුකරන ලද බරපතල ලිංගික අපයෝජනය හෝ සමූහ දූෂණය වැනි තත්ත්ව.

## 4. සාක්ෂි ආඥා පනතේ 155 (ඇ) වගන්තිය අවලංගු කිරීම

සාක්ෂිකරුවෙකු ලෙස ඇයගේ ගෞරවය දෝෂාභියෝගයට ලක් කිරීමට පැමිණිල්ලේ ලිංගික ඉතිහාසය පිළිබඳ සාක්ෂි ගෙන ඒමට විත්තිකරුට ඉඩ දීම, ස්ත්‍රී දූෂණයට සාධාරණය ඉටු කිරීමට බාධාවක් ලෙස ක්‍රියා කරයි. ස්ත්‍රී දූෂණය පිළිබඳව වරදේ කේන්ද්‍රීය අංගයවන කැමැත්තේ වැදගත්කම ද මෙම භාවිතයෙන් හැල්ලුවට ලක් කරයි.

ලිංගික ඉතිහාසය පිළිබඳ සාක්ෂි මත ඇති තහනම ඉවත් කිරීම ශක්තිමත් කිරීමට සහ මෙම ආරක්ෂාව සියලු පුද්ගලයින් සඳහා පුළුල් කිරීමට සාක්ෂි ආඥා පනතට පහත සඳහන් ව්‍යවහාරය එකතු කළ හැකිය:

> එවැනි පුද්ගලයෙකුට එරෙහිව සිදුවන ඕනෑම ආකාරයක ලිංගික හිංසනයක් පිළිබඳ නඩු විභාගයකදී පුද්ගලයෙකුගේ ලිංගික ඉතිහාසය අනුමත කළ නොහැක.

ඉහත නිර්දේශ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණයට අදාළ නීතිය සම්බන්ධ ප්‍රධාන කරුණු කිහිපයක් ඉවත් කිරීමට උපකාරීවන අතර, සාර්ථක නීති ප්‍රතිසංස්කරණ කිරීමෙන් පමණක් වින්දිතයින්ට සාධාරණය ඉටු වීම හෝ වැරදිකරුවන්ට ද දඬුවම් නොලැබීම අවසන් වීම තහවුරු නොවනු ඇත. කල්පවත්නා වෙනසක් අත්පත් කරගැනීම සඳහා සමානාත්මතාවය සහ ගෞරවය කෙරෙහි අවධානය යොමු කරන නීති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

**Women and Media Collective**
56/1, Sarasavi Lane, Castle Street,
Colombo 08, Sri Lanka.
Email: wmcsrilanka@womenandmedia.org
Web: womenandmedia.org
Facebook: https://www.facebook.com/womenandmediacollective
Twitter: https://twitter.com/womenandmedia